# චීන ගමනෙන් බලාපොරොත්තු ගොන්නක් මෙරටට
P 05

THE CHATHAM STREET JOURNAL
Trust your source. Trust your decisions. https://csj.lk/ 2023|10|22 Vol: 59



## විපක්ෂයේ IMF නරිවාදමට Sorry
P 04

## “අපට අවශ්‍ය ඔබේ ජයග්‍රහණය” පැරණි ලෝකය විනාශයට අතවනයි!
P 02







## තියෙන දෙයකින් වැඩක් ගැනීමේ ක්‍රමෝපාය
P 06-07


# ශික්ෂණයක් නැති සමාජයක්
P 12



## ආණ්ඩුව ඡන්දවලට බයද?
P 03



## රාජ්‍යය ගොඩනැගීමේ පුද්ගල අයිතීය සහ වගකීම
P 08



## එක් තීරයක් එක් මාවතක් සහ එක් නායකත්වයක්
P 10

# ජාතියේ කශේරුකාව රනිල්





කිසිවකු හෝ තවකෙකුගෙන් ණය මුදලක් ගැනීම තමන්ගේ දුර්වලතාවය ප්‍රකාශ කිරීමක් වන්නේ නැත. ණයක් ගන්නේ අවශ්‍යතාවයක් සම්පූර්ණ කරගෙන නැවත ණය ගෙවීමේ පොරොන්දුව මතය. පොරොන්දුවක් දෙන්න නම් ඒ පොරොන්දුව ඉටු කිරීමේ හැකියාව තිබිය යුතුය. සමත්කම කියන්නේ ඒකටය. මෙහිදී යම් යම් කොන්දේසිවලට යට වෙන්න සිදුවීම විය හැකි නමුත් එම කොන්දේසි වුවත් තමන්ට ඉටු කළ හැකි ලෙස කේවල් කිරීමේ හැකියාව තිබිය යුතුය. නමුත් ඒ කළ හැක්කේ තමන් තුළ ඊට හයියක් විශ්වාසයක් තිබේ නම් පමණි. එහෙම කේවල් කිරීමකින් ණය දෙන්නා එකඟවන තැනට පත්කර ගැනීමත් තවත් සමත්කමකි.

ශ්‍රී ලංකාව බංකොලොත් තැනට ඇද වැටීම, පෙර සිටි පාලකයන් ගත් වැරදි තීන්දු තීරණවල ප්‍රතිපලයකි. නමුත් නැවත නැගිටීමේ හැකියාව රටට තිබෙන බව ඉතා කෙටි කලකින් ඔප්පු කිරීමට හැකි විය. ඒ, ඊට නිසි නායකත්වය ලැබුණු නිසාය. අද ජනාධිපති රනිල් ලෝකයේ කේන්ද්‍රීය බල කඳවුරු දෙක සමඟ සමාන ගනුදෙනුවක් කරමින් රටේ අභිවෘද්ධියට කටයුතු කරමින්

P 02

# “අපට අවශ්‍ය ඔබේ ජයග්‍රහණය” පැරණි ලෝකය විනාශයට අතවනයි!



ගාසා තීරයේ පාලන බලය අත්පත් කරගෙන සිටින හමාස් සටන්කාමී සංවිධානය විසින් පසුගිය ඔක්තෝබර් 7 වැනිදා ඊශ්‍රායලයට එල්ල කළ රොකට් ප්‍රහාරයෙන් පසු තවදුරටත් ඊශ්‍රායලය විසින් අඛණ්ඩව දෙසතියක් පුරා ගාසා තීරයට ප්‍රහාර එල්ල කරමින් සිටියි. හමාස් සටන්කාමීන්ගේ පළමු ප්‍රහාරයෙන් ඊශ්‍රායලයේ 1400ක පමණ ජනතාවක් මරණයට පත් වූ බව විදෙස් වාර්තා සඳහන් කර තිබූ නමුත් ලෝකයේම අවධානය මේ කෙරේ යොමු වීමට ප්‍රබලම සාධකය වූයේ, හමාස් ප්‍රහාරයෙන් දින 10කට පසු එනම් ඔක්තෝබර් 17 වෙනිදා ගාසා නගරයේ ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි අල්-අහ්ලි අරාබි රෝහල ඉලක්ක කොට සිදුවූ ප්‍රහාරයයි. ඒ හරහා එතෙක් බටහිර ගැතිව කටයුතු කළ රටවල පවා අනුකම්පාව මුසු අවධානය ප්‍රහාරයන් හමුවේ පීඩාවට හා අසරණභාවයට පත් වූ ගාසා වැසියන් කෙරේ යොමු වීම සිදුවිය.

ඊශ්‍රායලය විසින් ගාසා තීරයේ හමාස් සටන්කරුවන් ඉලක්ක කර ප්‍රහාරයන් එල්ල කිරීමට සමගාමීව සිය සියලු බලයන් යොදා සමස්ත ගාසා වැසියන්ට ජලය, විදුලිය, ආහාර වගේම ඖෂධ ලැබෙන මාර්ග අවහිර කිරීමට කටයුතු කළේය. එසේ කිරීමට ඔවුන්ට හැකියාව ඇත්තේ, ගාසා වැසියන් එළිමහන් සිරකරුවන් බවට පත්කරමින් ඊශ්‍රායලය විසින් 1994 සිට ගාසා තීරය හා ඊශ්‍රායල් දේශසීමාව වටා ඉදිකර ඇති යකඩ තාප්පය හේතුවෙනි. ඊජිප්තු දේශ සීමාව වටා ද ආරක්ෂක වැටක් ඉදිකර ඇත. මේ හේතුවෙන් ගාසා තීරයට ප්‍රවේශ විය හැකි ගොඩබිම් පිවිසුම් මාර්ග ඇත්තේ දෙකක් පමණි. එම නිසාම මේ වන විට වර්ග කිලෝමීටර් 410ක පමණ බිම්කඩක් ඇතුළේ කොටු වූ මිලියන 2ක් පමණ මිනිසුන් විඳින දුක් අඳෝනා කෙරේ ලෝකයේම අවධානය යොමු වී තිබෙන පසුබිමක පැරණි ලෝක බලවතුන්ගේ ආකල්පය තව තවත් යුද්ධය හරහා ජයග්‍රහණ අත්කරගත යුතු බවය.

ඊශ්‍රායල් ආරක්ෂක හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී, ලුතිනන් ජෙනරාල් හර්සි හැලෙවි සිය හමුදා සොල්දාදුවන්ට උපදෙස් දී ඇත්තේ, **“දැන් අපගේ වගකීම වන්නේ ගාසා තීරයට ඇතුළුවීම, හමාස් සංවිධානය සූදානම් කරන, ක්‍රියා කරන, සැලසුම් කරන සහ ප්‍රහාර දියත් කරන ස්ථාන ඉලක්ක කරන්න. සෑම තැනකම ඔවුන්ට පහර දෙන්න, සෑම අණ දෙන නිලධාරියෙක්ම, සෑම ක්‍රියාකාරයෙක්ම යටිතල පහසුකම් විනාශ කරන්න. තනි වචනයෙන් කියනවා නම්, දිනන්න.”** කියාය. ඔහු තවත් වරෙක ප්‍රකාශ කර සිටියේ, අප ජයග්‍රහණය අත්කරගත යුතු බවත් ඒ සඳහා ඊට විරුද්ධ සියලු දෙනාට එරෙහිව සටන් වදින බවය. එසේම ගාසා තීරය අත්පත් කරගැනීම වෙනුවෙන් ගත හැකි සියලු පියවර ගැනීමට කටයුතු කරන බවය. එසේම ඊට එරෙහිව අවි ඔසවන සියලු දෙනාට එරෙහිව සටන් වැදීමට තමන් සූදානම් බවද ඔහු අවධාරණය කරයි.

ඉන් නොනැවතුණු ඊශ්‍රායල් හමුදාව (IDF) විසින් ගාසා තීරයට සේවා සැපයුම් අවහිර කිරීමේ අරමුණින් ඇලෙප්පෝ සහ ඩැමස්කස් අගනුවර ගුවන් තොටුපළ දෙකට රොකට් ප්‍රහාරයන් එල්ල කළේය. මේ සම්බන්ධයෙන් හමුදා මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් හර්සි හැලෙවි අවධාරණය කර සිටියේ, **“අපි ගුවන් තොටුපොල දෙක විනාශ කළා. ඊශ්‍රායල් ස්වෛරීත්වයට ප්‍රතිචාර දක්වන ලෙස අපි ඉරානයට සහ අසාද් රෙජීමයට අභියෝග කරන්නෙමු, මෙය පූර්වගාමී ක්‍රියාවක් පමණයි.”** කියාය.

මෙකී කරුණු අනුව පැහැදිලි වන්නේ, ඊශ්‍රායලය තමන්ගේ ස්වෛරීභාවය වෙනුවෙන් පූර්ණ යුද්ධයකට සූදානමින් සිටින බවය. ඒ වෙනුවෙන් මේ මොහොතේ සියලු හමාස් සටන්කාමීන් මහ පොළොවෙන් අතුගා සහමුලින්ම විනාශ කිරීම ඔවුන්ගේ එකම අරමුණ බවය. නමුත් එකී ඒකපාර්ශවීය යුධමය ප්‍රතිචාරය නිසා ගාසා තීරයේ ජීවත්වන සාමාන්‍ය වැසියන්ට විශේෂයෙන්ම ජනගහනයෙන් අඩක් පමණ වන දරුවන්ට අත්වන ඉරණම සම්බන්ධයෙන් බටහිර ලෝකයේ බලාධිකාරයට කිසිඳු සානුකම්පාවක් නොමැති බව දැන් දැන් පෙන්නුම් කරමින් සිටිති.

ගාසා තීරයේ අසරණභාවයට පත්ව දුක් විඳින මිලියන දෙකක් පමණ වූ මිනිසුන්ට අවශ්‍ය ඖෂධ, ආහාර, ජලය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයුම් කිරීම වෙනුවෙන් සටන් විරාමයක් අවශ්‍ය බව එක්සත් ජාතීන්ගේ සංවිධානය අවධාරණය කර සිටියේය. මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වූ සටන් විරාම යෝජනාව ඇමරිකාව විසින් සිය නිෂේධ බලය භාවිත කර පරාජය කරන ලද බව විදෙස් මාධ්‍ය වාර්තා කොට තිබිණි. එසේම ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් ඊශ්‍රායලයේ සංචාරයක නිරත වෙමින් තමන්ගේ සහාය ඊශ්‍රායලය වෙත ලබාදෙන බව අවධාරණය කළේ, ගාසා තීරයේ රෝහලට එල්ල කළ ප්‍රහාරය පලස්තීන් සටන්කාමීන්ගේම ප්‍රහාරයක් බව ප්‍රකාශයක් ද සිදුකරමිනි. එසේම ගාසා රෝහලේ සමූලඝාතනය ගැන ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍ය නොවන බව ද එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව අවධාරණය කර සිටියේය.

එසේම ඊශ්‍රායලයේ සංචාරයක නිරත එක්සත් රාජධානියේ අග්‍රමාත්‍ය රිෂි සුනක් ටෙල් අවීව්හිදී ඊශ්‍රායල් අග්‍රාමාත්‍ය බෙන්ජමින් නෙතන්යාහු හමුවෙමින්, හමාස් සංවිධානය හඹායෑමට ඊශ්‍රායලයට ඇති අයිතියට එක්සත් රාජධානිය පූර්ණ සහාය දෙන ලබාදෙන බව සවිත කර ඇත. එසේම ඔහු වැඩිදුරටත් අවධාරණය කර ඇත්තේ, **“අපට අවශ්‍ය ඔබේ ජයග්‍රහණය”** කියාය.

ඊශ්‍රායලයේ යුධ උන්මාදයේ සහායට ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය එසේ ප්‍රකාශ නිකුත් කරමින් සිටිය දී රුසියාව මේ සම්බන්ධයෙන් දක්වන්නේ වෙනස් මතයකි. ඒ ඊශ්‍රායල-පලස්තීන ගැටුම දේශපාලන හා රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවලින් මිස බලහත්කාරයෙන් විසඳිය නොහැකි බවය. ඒ නිසාම රුසියාව ගාසා වැසියන් වෙනුවෙන් වහාම සටන් විරාමයක් ඉල්ලා සිටියේය. ප්‍රචණ්ඩත්වය අත්හැරීම සහ මැද පෙරදිග තිරසාර සාමයක් ඇති කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ සහාය ඇතිව සාකච්ඡා ක්‍රියාවලියක් ආරම්භ කළයුතු යැයි ද අවධාරණය කර සිටියේය. එසේම ඊශ්‍රායල්-පලස්තීන දේශපාලනික ගැටුමට විසඳුම ලෙස රුසියානු ජනාධිපති පුටින් පෙන්වා දුන්නෙ, **“නැගෙනහිර ජෙරුසලම අගනුවර කොටගත් ස්වාධීන පලස්තීන රාජ්‍යයක් නිර්මාණය කිරීම”** බවය. එසේම හමාස් සංවිධානය, යුරෝපා සංගමය සහ ප්‍රංශය විසින් ත්‍රස්තවාදී වර්ගීකරණයෙන් ඉවත් කිරීමට ගත් තීරණයට එකඟ වූ රුසියාව ද හමාස් සංවිධානය ත්‍රස්තවාදීන් යැයි ලැයිස්තුගත කිරීම ප්‍රතික්ෂේප කර තිබේ.

මේ සම්බන්ධයෙන් ඇමරිකානු ජනාධිපතිවරයා වොෂින්ටන්හි ධවල මන්දිරයේ දී ජාතිය අමතා ප්‍රකාශ කර සිටියේ, **“අපට හමාස් වැනි ත්‍රස්තවාදීන්ට සහ පුටින් වැනි තක්කඩින්ට ජයග්‍රහණය කිරීමට ඉඩ දිය නොහැක. එය සිදුවීමට ඉඩ දීම මම ප්‍රතික්ෂේප කරනවා”** කියාය.

ලෝක බලවතුන්ගේ පමණක් නොව ලිබියාව වැනි රටවල් ද යුධ උණුසුම තවතවත් තීව්‍ර කරමින් ප්‍රකාශ නිකුත් කිරීමට පෙළඹී සිටී. **“අපි ලිබියාවේ සිට ගාසා තීරයට ආයුධ ප්‍රවාහනය කිරීමට සූදානම්, දේශසීමා විවෘත කිරීමට අවස්ථාවක් උදා වුවහොත් ඒ සඳහා සම්බන්ධ වීමට හොඳින් පුහුණු වූ සටන්කාමීන් පිරිසක් අප සතුව ඇත.”** යැයි නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ (HoR) සහ අරාබි පාර්ලිමේන්තුවේ ලිබියාවේ නියෝජිත හසන් බර්ග්හෝති අවධාරණය කර සිටියේය. ලෝක බලවතුන්ගේ සහ ඒ ඒ රටවල මේ මැදිහත්වීම් විසින් ලෝකයට කියා සිටින්නේ තවදුරටත් ගාසා තීරයේ පමණක් නොව ලොව විවිධ තැන්වල සාමාන්‍ය වැසියන් තව තවත් අසරණභාවයට, පීඩාවට හා මරණයට පත්වීමට සූදානම් විය යුතු බව නොවේද?

වසර 75කට අධික කාලයක් පුරා පලස්තීනය සම්බන්ධයෙන් ලෝක බලවතුන්ගේ විසඳුම ඔවුන්ගේ භූ-දේශපාලන වුවමනාව, ආර්ථික බලවන්තකම හා යුදමය සුරක්ෂිතභාවය පදනම් කොටගෙන සිදුවිය. නමුත් අද පැරණි බටහිර ලෝක බලවතුන්ගේ ආර්ථික දේශපාලන ශක්තිය ක්‍රමයෙන් හීන වෙමින් පවතින අතර ආසියානු කලාපය වටා බලය කේන්ද්‍රගත වෙමින් තිබෙන බව පැහැදිලිය. ඒ නිසාම මියැදෙමින් පවතින පැරණි ලෝක බලවන්තයන්ගේ උත්තර තවදුරටත් ලෝක සාමයේ පැවැත්ම රඳා නොපවතින ඇත. මන්ද බලය පිළිබඳ ප්‍රශ්නයකට ඔවුන්ද මැදිව සිටින බැවිනි. මේ නිසා ඔවුන්ගේ මැදිහත්වීම තවත් දරුණු අපරාධ ලෝකයට ඉතිරි කරනු ඇති බව ඉතිහාසයේ අත්දැකීම් විසින් ඔප්පු කොට හමාරය. එමනිසා “අපට අවශ්‍ය ඔබේ ජයග්‍රහණය” යැයි රිෂි සුනෙක් ඊශ්‍රායලයේ යුද උන්මාදයට ශක්තියක් සපයමින් පැවසූ නමුත් අද ලෝකයමට අවධාරණය විය යුත්තේ ” අපට අවශ්‍ය ඔබේ ජයග්‍රහණයයි. ඒ ලෝක මිනිස්කමේ ජයග්‍රහණය මිස යුදකාමීන්ගේ ජයග්‍රහණය නොවන බවය.

නවන් පතිරත්න

# ජාතියේ කශේරුකාව රනිල්

කිසිවකු හෝ තවකෙකුගෙන් ණය මුදලක් ගැනීම තමන්ගේ දුර්වලතාවය ප්‍රකාශ කිරීමක් වන්නේ නැත. ණයක් ගන්නේ අවශ්‍යතාවයක් සම්පූර්ණ කරගෙන නැවත ණය ගෙවීමේ පොරොන්දුව මතය. පොරොන්දුවක් දෙන්න නම් ඒ පොරොන්දුව ඉටු කිරීමේ හැකියාව තිබිය යුතුය. සමත්කම කියන්නේ ඒකටය. මෙහිදී යම් යම් කොන්දේසිවලට යට වෙන්න සිදුවීම විය හැකි නමුත් එම කොන්දේසි වුවත් තමන්ට ඉටු කළ හැකි ලෙස කේවල් කිරීමේ හැකියාව තිබිය යුතුය. නමුත් ඒ කළ හැක්කේ තමන් තුළ ඊට හයියක් විශ්වාසයක් තිබේ නම් පමණි. එහෙම කේවල් කිරීමකින් ණය දෙන්නා එකඟවන තැනට පත්කර ගැනීමත් තවත් සමත්කමකි.

ශ්‍රී ලංකාව බංකොලොත් තැනට ඇද වැටීම, පෙර සිටි පාලකයන් ගත් වැරදි තීන්දු තීරණවල ප්‍රතිඵලයකි. නමුත් නැවත නැගිටීමේ හැකියාව රටට තිබෙන බව ඉතා කෙටි කලකින් ඔප්පු කිරීමට හැකි විය. ඒ, ඊට නිසි නායකත්වය ලැබුණු නිසාය. අද ජනාධිපති රනිල් ලෝකයේ කේන්ද්‍රීය බල කඳවුරු දෙක සමඟ සමාන ගනුදෙනුවක් කරමින් රටේ අභිවෘද්ධියට කටයුතු කරමින් සිටින්නේ ඒ නායකත්වයේ ගුණය නිසාය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සිය දෙවන ණය වාරිකය ලබාදීම සඳහා මේ මොහොත වන විට එකඟව තිබේ. මේ එකඟතාවය ලැබෙන්නේ මූල්‍ය අරමුදලේ කොන්දේසි සියල්ල ඉටුකර සම්පූර්ණ කර නොමැති තත්වයන් හමුවේය.

එතෙක් මෙම ණය සහය නොලැබෙනු ඇති බවට ජනාධිපතිවරයාට චෝදනා කරමින් උසුලු විසුළු කරමින් විපක්ෂ කොටස් දඟලමින් සිටියේය. ජනතාව පීඩාවට පත්වන තීරණ ගත නොහැකි නිසා මූල්‍ය අරමුදලේ නිර්දේශ ඒ ආකාරයෙන්ම ඉටු කළ නොහැකි බවත් අපට කළ හැකි දේ මෙපමණ බවත් පෙන්වා දෙමින්, රටේ කොන්දේසිවලට මූල්‍ය අරමුදල එකඟ කරවා ගැනීමට ජනාධිපතිවරයාට හැකිව තිබිණි. ඒ අනුව ජනතාව වෙනුවෙන් කේවල් කිරීමේ සමත්භාවය ඔහු පෙන්වා ඇත. මේ අතර චීනය සමඟ ගනුදෙනුවේදීත් චීන ජනාධිපතිවරයා කිසිඳු දේශපාලනික කොන්දේසියකට ශ්‍රී ලංකාව යටත් නොකරමින් දිය හැකි උපරිම සහය දෙන බවට ජනාධිපති රනිල් වික්‍රමසිංහට පොරොන්දු වීමත් ඓතිහාසික ප්‍රතිඵලයකි. මන්ද චීන ණය කියන්නේ උගුලක්ය, ඒ නිසා චීනෙත් එක්ක ගනුදෙනු පරිස්සමෙන්ය, යන්න ලෝකයේ පොදු මතයක්ව තිබෙන වකවානුවක, චීන ණය, උගුලක් නොවී ගැලවීමේ මාර්ගයක් බවට පත්කර ගැනීමට ජනාධිපතිවරයා සමත් වීමය. ඒ අනුව ජනාධිපතිවරයා ඒ ගනුදෙනුවත් බේරාගත්තේ රටට වඩාත් වාසි වන ආකාරයෙන්ය.

මූල්‍ය අරමුදලේ සහය අඛණ්ඩව හිමි කරගැනීමත් චීනය මෙරට ආර්ථිකය වෙනුවෙන් ලබා දියහැකි සහය කොන්දේසිවලින් තොරව ලබාදෙන බවට පොරොන්දු වීමත් සිදු වන්නේ ජනාධිපතිවරයා පසුගිය කාලය මුළුල්ලේ කළ ජාත්‍යන්තර මෙහෙයුමේ ප්‍රබලත්වය නිසාය. තමන් බටහිර ගැත්තකු නොවන බවත් චීන ගැත්තකුද නොවන බවත් මෑතකදී විදේශ මාධ්‍යයක් හමුවේ අවධාරණය කළ ජනාධිපති කීවේ තමන් ශ්‍රී ලංකාවේ ගැත්තකු පමණක් බවය. ඔහු එය භාවිතාවෙන්ම ඔප්පු කළේ මේ කඳවුරු දෙකේම සහය මෙරටට ලබා දෙමින්ය.

ගෝලීය බල කේන්ද්‍ර දෙකක් හා සංවාද විසංවාද කරමින් රටට අවශ්‍යම දේ ඒ අවශ්‍යම ආකාරයට ලබාගැනීමට සමත් වීම රටේ අභිමානය රැකගැනීමකි. බල කඳවුරු ඉදිරියේ නිවට නියාලුව වැඳ වැටෙනවා වෙනුවට, බලවත් විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් රටේ වටිනාකම පෙන්වමින්, ලෝකය තුළ තමන්ගේ තැන ආරක්ෂා කරගෙන සිටීම පහසු වැඩක් නොවේ. මෙරට ඇතැම් නායකයන් තමන්ගේ කන්‍යාභාවය මෙන් රැකගත් දේශපාලන ප්‍රතිපත්ති පවා, පාවාදෙමින් වාසියට, ලේසියට, කාසියට බලකඳවුරු හා ගනුදෙනු බේරාගැනීමට දෙකට නැවෙන විට ජනාධිපති රනිල් කියන්නේ ඍජු දේශපාලනික කශේරුකාවත් සහිත මහ පුරුෂයෙකි.

එය දැන් රටේම කශේරුකාවය.

# ආණ්ඩුව ඡන්දවලට බයද?

ජනාධිපතිවරයාත් ආණ්ඩුව ඡන්දවලට බය බවත් ඒ නිසා ඡන්ද කල් දැමීමට උපක්‍රම පාවිච්චි කරමින් සිටින බවත් මේ දිනවල විපක්ෂය උස්සාගෙන යන සටන් පාඨයක්ව තිබේ. ඡන්දයක් කියන්නේ ජනතාවට රාජ්‍ය පාලනය වෙනුවෙන් තමන්ගේ අභිලාෂයන් නියෝජනය කිරීම සඳහා තමන් කැමති, තමන් විශ්වාසය රඳවන, වඩාත්ම හොඳම නියෝජිතයන් තෝරා පත්කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රම සහිත රටවල යොදා ගන්නා ක්‍රමවේදයයි. මේ ක්‍රමවේදයට පාලකයන් බය විය යුත්තේ ඔවුන් වෙතින් ජනතා අභිලාෂයන් මුදුන්පත් කරවන වැඩසටහන ක්‍රියාත්මක කළ නොහැකිව අසරණ වී ඇති නම් පමණි. නමුත් වත්මන් ජනාධිපතිවරයාත් ආණ්ඩුවත් සිටින්නේ එවැනි අසරණ භාවයක නොවේ. බංකොලොත්ව කරකියා ගන්න බැරි තැනට රටත් ජනතාවත් ඇද වැටුණු තැනින් ගොඩගැනීමට සමත් වූ ජනාධිපතිවරයකුට සහ ආණ්ඩුවකට එසේ බිය වීමට හේතුවක් නැත. විශේෂයෙන්ම එම අභියෝගය භාරගැනීමට විපක්ෂය කර හැර තිබුණු මොහොතක එය භාරගත්තේ ජනාධිපතිවරයාය. එසේම ඔහුගේ වැඩපිළිවෙල දිගින් දිගටම කඩාකප්පල් කරන්න මේ විපක්ෂය ගත් සියළු උත්සාහයන් පවා පරාජය කරමින් ජනතා අභිලාෂයන් සපුරාලන්නට ගත යුතු පියවරයන් ගැනීමට රජයට හැකිව තිබිණි. එපමණක් නොව අනාගත සංවර්ධනය වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග පවා මේ වන කොට තෝරා අවසන්ය. රට සංවර්ධනය සඳහා රැගෙන යායුතු මාර්ගයට ඇද දමා අවසන්ය. ඒ අනුව ජනාධිපතිවරයාට හෝ ආණ්ඩුවට ඡන්දවලට බිය වීමට හේතුවක් නැත.

එහෙත් ඡන්දවලට ජනතාව බිය විය යුතුය. මන්දයත් මේ රටේ පවතින ඡන්ද ක්‍රමය මඟින් රටට සිදු වී ඇති අවුල නිසාය. ඡන්දයක ප්‍රතිඵලය කුමක් වුවත් අවසානයේ අවුල් ජාලවකට රට ඇද දමා එය කෙළවර වීම ගැන අත්දැකීම් එමට තිබේ. ඡන්ද මඟින් සියල්ල නිවැරදි කරන්නේ නැත. යළි යළි එකම ගොහොරුවට රටත් ජනතාවත් ඇද දැමෙනවා නම් ජනවරම යන්නද ඒ ගොහොරුවේම විකාරයකි.

මහජන ඡන්ද විමසීමකදී රටට වඩාත් ගැලපෙන එනම් රටේ අභිවෘද්ධියට ගැලපෙන, ඒ වුවමණාවන් සපුරන ආකාරයේ මහජන නියෝජිතත්වයක් අදාළ ආණ්ඩු කරන දේශපාලන ආයතනවලින් නියෝජනය විය යුතුය. එසේම මහජන නියෝජිතයන් තෝරාගැනීම වඩාත් සාධාරණ පදනමකින් විය යුතුය. එහෙම වූවත් එම ආයතන ව්‍යුහයද රටේ අනාගත අරමුණු සාක්ෂාත් කරන ව්‍යුහාත්මකව නිවැරදි ක්‍රමවේදයකට සකස් විය යුතුය. පුරවැසි ජනතාව සමස්තයක් ලෙස ගෙන නිවැරදිම ලෙස තීන්දු තීරණ ගැනීමේ හැකියාව සහිත විය යුතුය. එපමණක්ම ප්‍රමාණවත් නැත. මෙම දේශපාලන ආයතන සහ මහජන නියෝජිතයන් ක්‍රියාත්මක විය යුතු පිළිවෙලක්ද තිබිය යුතුය. එය රටත් ජනතාවත් මුල් කරගත් ප්‍රතිපත්තිමය වැඩපිළිවෙලක් විය යුතුය. පටු දේශපාලනික වුවමණාවන්ට, බලය පිළිබඳ කෑදරකමට කරන සරළ ජනප්‍රිය දේශපාලනය වෙනුවට වගකීම් සහගත ලෙස රට ගැන ජනතා ගැන තීන්දු තීරණ ගන්නා අවකාශයක් බවට මෙම ආයතන සකස් විය යුතුය.

මේ කිසිවක් ගැන යම් තහවුරුවක් නොමැතිව තවත් ඡන්ද කෙරුවාවකින් විය හැකිව තිබෙන විශ්මකර්ම වැඩ ඇත්තේ නැත. බලයට පැමිණෙන්නේ කවුද කියන එක මෙතැන වැදගත් නැත. කවුරු බලයට ආවත් නිවැරදි පිළිවෙලක් ක්‍රියාත්මක වන බවට සහතිකයක් තිබිය යුතු වීම වැදගත්ම කාරණයය. අඩුම තරමින් තමන් පත් කරන නියෝජිතයා තමන් කෙරෙහි වගකීම් සහගතභාවය හෝ ප්‍රදර්ශනය කිරීම ජනතාවට අපේක්ෂා කළ හැකි විය යුතුය.



පසුගිය දිනවල හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නසීර් අහමඩ්ට මන්ත්‍රීධුරය අහිමිවීමේ සිද්ධිය පදනම් කරගෙන පක්ෂ මාරුකිරීම වැලැක්වීම ගැන සංවාදයක් ඇතිව තිබිණි. නමුත් මේ සඳහා මීට පෙර අවස්ථාවල නීති පැනවීමට ගත් උත්සාහයට හෝ පාර්ලිමේන්තු මහජන නියෝජිතයන් සහය දුන්නේ නැත.

මේ සම්බන්ධයෙන් පොදු සමාජ කියවීම වන්නේ පක්ෂයක් නියෝජනය කරමින්, ප්‍රතිපත්තියක් නියෝජනය කරමින්, ජන කොටසක් නියෝජනය කරමින් හෝ පත්වුවා නම් ඒ වගකීම ඉටුකිරීමට අදාළ නියෝජිතයා බැඳී සිටිය යුතුය, තම පෞද්ගලික වුවමණාවන් හෝ හෘද සාක්ෂිය මත පදනම්ව හෝ කියමින් පක්ෂ මාරු කිරීම නොවිය යුතුය, කණ්ඩායමක් නොමැති තනි නියෝජිතයකුට එවැනි තීරණයක් ගත හැකි නමුදු කණ්ඩායම් නියෝජනයකදී ඒ සඳහා අවස්ථාව තිබිය යුත්තේ යළි මහජන කැමැත්ත විමසීමකදී හෝ අදාළ කණ්ඩායම ගන්නා පොදු තීන්දුවක් අනුව පමණක් විය යුතුය යන්නය. නමුත් මේවා මෙසේ සිදු නොවන බව සුලබ අත්දැකීමය. පෞද්ගලික ලාබ අපේක්ෂාවන් මත පක්ෂ මාරුකිරීම් සුලබය. එසේම මනාප ක්‍රමයේ අවුල ගැන තවදුරටත් විවාද කරන්න දෙයක් නැත. එය වෙනස් කළ යුතුය. තමන්ගේ මැතිවරණ කොට්ඨාශයට වෙන්වූ මන්ත්‍රීවරයකු නොමැතිවීමේ මැසිවිල්ලද පරණ එකකි. එය තවමත් වෙනස් කරගැනීමට හැකි වුණේ නැත. මේ ආදී වශයෙන් පවතින අවුල් සහගත තත්වයන් රැසක් තිබේ. මේ ගොහොරුවම තවදුරටත් පවත්වාගෙන යමින් ඡන්ද පැවැත්වීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් රටට නැත.

කොහොම නමුත් මේ අඩුපාඩු සැකසීම ගැන බොහෝ කාලයක සිට සාකච්ඡාවන් පැවැත් විණි. මැතිවරණ ක්‍රමය ගැන කොමිසම් වාර්තා, කමිටු වර්තා කප්පරක් තිබිණි. සිදු කළ වෙනස්කම්ද තිබිණි. වෙනස්කම් නිසා ගැටළු තවදුරටත් අවුල් වීමත් සිදුව තිබිණි. මේ තත්වයන් මත මැතිවරණ ක්‍රමය මුළුමනින්ම පාහේ දූෂිත මෙන්ම විකෘතියක් බවට පත්වීම සිදුව තිබේ. රජයේ පාර්ශ්වයෙන් මේ ක්‍රමය වෙනස් කිරීම ගැන අදහසක් ප්‍රකාශයට පත්වෙනවාත් සමඟ විපක්ෂයේ කලබලය තේරුම් ගත හැකිය. ඒ මෙම දූෂිත සහ විකෘති ක්‍රමය තමන්ගේ පැවැත්මට නැති නම් තමන්ගේ බල වුවමණාවට අවශ්‍ය බව ඔවුන් පිළිගෙන තිබෙන බවය. විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස සියල්ලටම කලින් තමන්ගේ කලබලය පෙන්වා තිබිණි.

**"සෘජු හා සමානුපාතික ක්‍රමයට මන්ත්‍රීවරුන් තෝරා ගැනීම සඳහා දැනට පවතින පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම හා ඡන්දය සඳහා ඇප මුදල් තැන්පත් කිරීම සම්බන්ධයෙන් වූ සාකච්ඡාවකට අගමැතිවරයා ආරාධනා කර ඇති බවත්, පළාත් පාලන මැතිවරණය, පළාත් සභා මැතිවරණය සහ මහ මැතිවරණය කල් දමමින් ජනතාවගේ ඡන්ද අයිතිය හා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම උල්ලංඝණය කර ඇති වත්මන් රජය සමඟ සමගි ජන බලවේගය කිසිඳු අවස්ථාවක මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමේ සාකච්ඡාවකට නොයෙන බවත්, යම් හෙයකින් මැතිවරණ ක්‍රමය වෙනස් කරන්නේ නම් එය සිදු කළ යුත්තේ විධිමත් ජනවරමකින් පසුව බවත්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා අද (18) පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා."** මේ ඔහුගේ පාර්ශ්වයෙන් නිකුත් කෙරුණ නිවේදනයක කොටසකි.

විපක්ෂ නායකයා කියන විදිහට දැන් මෙම මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම මැතිවරණයකින් පසුව වන විධිමත් ජනවරමකින් විය යුතුය. සජිත්ගේ මේ පටු තේරුම් ගැනීම සිදුවන්නේ තමන් මීළඟ මැතිවරණයෙන් බලයට පත්වෙනු ඇතැයි කියන සිතුවිල්ල නිසාය. එය ජාතික ජන බලවේගයේ අනුර කුමාරටත් ඇති සිතුවිල්ලකි. මොකද ඔහුත් මේ හා සමානම අදහසක් දරණ නිසාය. මේ දෙදෙනාම බලාගෙන සිටින්නේ මීළඟ ජනාධිපති වීමටය. මීළඟ ආණ්ඩුව පිහිටු වීමටය. එහෙත් මේ දෙදෙනාටම එකවර එය සිදු කළ නොහැක. දිනන්න පුළුවන් එක් පාර්ශ්වයකට පමණි. එය ඔවුන්ද නොදන්නා කාරණයක් නොවේ. මේ අනුව පැහැදිලි කාරණය මැතිවරණ ප්‍රතිපලය ගැන දැන් පූර්ව නිගමනයකට පැමිණෙන්න නොහැකි බවය. එය අවිනිශ්චිතය. සමහර විට මේ වන විට ආණ්ඩු බලයේ සිටින කණ්ඩායමම වුවත් බලයට පැමිණිය හැකිය. එසේම එජාපයට තනිවම බලයට පැමිණිය හැකි වීමද සිදු විය හැකිය. නැති නම් වෙනත්ම කණ්ඩායමක් හෝ බලයට පැමිණිය හැකිය. එසේත් නොවී කිසිවකුට බහුතර බලයක් නොමැතිව හවුල් ආණ්ඩුවක් පිහිටුවා ගැනීමක්ද සිදු විය හැකිය. වත්මන් දේශපාලන තත්වයන් අනුව වඩාත්ම ආසන්න ප්‍රතිපලය විය හැක්කේ එයය. එවැනි මෙහොතක විපක්ෂ නායකවරයා පවසන විධිමත් ජනවරම ප්‍රකාශවන්නේ කෙසේද යන්න ගැටළුවකි.

කොහොම නමුත් තමන් බලයට පැමිණෙන්නේ යැයි සිතන පටු උපකල්පනය මත සිට රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය නිරවද්‍ය ලෙස ප්‍රකාශ කිරීමට බාධා කරන පවතින මැතිවරණ ක්‍රමයේ අවුල වෙනස් කිරීමට ගෙන තිබෙන පියවර පරාජය කිරීමට විපක්ෂය තීන්දු කිරීම මොන තරම් සැහැසි තීරණයක්ද කියන එක පැහැදිලිය. වැරදි දේ නිවැරදි දේ බවට පත්කර ගැනීමකින් මිසක් ඉදිරියට යෑමක් වන්නේ නැත. ඒ සඳහා අවස්ථාව එළඹ ඇති විට එය කළ යුතුය. හැමදාමත් විවිධ පාර්ශ්වික දේශපාලනික වුවමණාවන් මත කල් දැමීම, කඩාකප්පල් කිරීම හෝ දිගටම සිදු වීමේ ප්‍රතිඵල අත්විඳිමින් 75 වසරක් මුළුල්ලේ කෙරුවේ මොනවාදැයි ප්‍රශ්න කරන මෝඩ පිළිවෙත දැන්වත් වෙනස් විය යුතුය.

පසුගිය සතියේදීත් අප මෙම තීරුවෙන් මතු කළ කාරණය වූයේ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීමට රජය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එනවා කියන රාවයට ඊට සහය නොදී සිටීමට විපක්ෂ දේශපාලන පක්ෂ ගත් තීරණයත් මෙවැනිම මුග්ධ සහ බලලෝභය පදනම් කරගත් දෙයක් බවය.

විපක්ෂයේ දේශපාලනය එතරම්ම සිල්ලර ප්‍රාථමික මුග්ධ තැනකට වැටී තිබුණත් ජනාධිපතිවරයා කටයුතු කරමින් සිටින්නේ රට ගැන වන දැඩි වගකීම් සහගත බවකිනි. ඔහු තමන්ගේ පාර්ශ්වික දේශපාලන අපේක්ෂා නොතකා රටේ අනාගතය සුබවාදී තැනකට ගෙන ඒමටත් ජනතාවගේ අභිලාෂයන් තෘප්තිමත් කරන තැනකටත් රටේ ආර්ථිකය හසුරුවමින් සහ ජාතන්තර දේශපාලනය තුළ මෙතෙක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නායකයකු නොකළ මට්ටමේ බරපතල මැදිහත් වීමක් කරමින් රටට දේවල් දිනා ගැනීම වෙනුවෙන් ප්‍රශස්ථ කර්තව්‍යයක යෙදී සිටී.

ඔහු මේ වන විට රටේ ආර්ථිකය සකස් කිරීම වෙනුවෙන් ඉදිරිපත්කර තිබෙන වැඩපිළිවෙල, සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන සමස්ත ක්‍රමපද්ධතියේ පූර්ණ වෙනසක් කිරීම වෙනුවෙන් සැකසුනකි. පැලැස්තර කෙටිකාලීන ජනප්‍රිය විසඳුම් වෙනුවට දුෂ්කර සංකීර්ණ තත්වයන් කළමනාකරණය කරමින් දීර්ඝ කාලීනව ප්‍රතිලාභ ලැබෙන ක්‍රම පද්ධතියක් සැකසීම ඔහුගේ වුවමනාව වී ඇත. මේ අනුව එකින් එක සම්බන්ධ වන සියලු ක්ෂේත්‍රයන් සමගාමී වෙනස්කමකට ලක්කරමින් රට ගෙන යන්න හදන්නේ ඉහළ පිම්මක් පැන්නීමට බව පැහැදිලිය. ඒ දෙස බැලිය යුත්තේ සමස්ත චිත්‍රය ගැනම විමසමිනි. එතැනින් මෙතැනින් කෑලි අල්ලාගෙන සමස්තය දැකිය නොහැක. විපක්ෂයට සිදුව ඇත්තේ මේ කෑල්ලක් දෙකක් අල්ලාගෙන සමස්තය ගැන අදහසක් ප්‍රකාශ කරන්න යෑමේ අවුලය. බොහෝ විටම එය විපක්ෂයේ නොදැනුම අනවබෝධයන් අනුව ඒ ඔවුන්ට පහසු විය හැකිය. නැතිනම් මේවාට කන් දෙන මිනිස්සු නොමඟ යැවීම තමන්ගේ ජරාජීර්ණ දේශපාලනයට වාසි සහගත බව කල්පනා කිරීම නිසා හිතා මතාම බොරුව සමාජගත කරනවාද විය හැකිය.

කෙසේ නමුත් රටේ යම් දේශපාලනික ප්‍රතිසංස්කරණයක් ගැන ජනාධිපතිවරයා අදහස් දක්වන්නේ එමඟින් රටේ ආර්ථිකයට වන බලපෑම ගැන තක්සේරුවක් ඇතිවය. ආර්ථිකය ගැන දෙයක් යෝජනා කරන්නේ රටට අවශ්‍ය දේශපාලනික ස්ථාවර බව සහතික කරගැනීම ගැන ගණන් බලමිනි. මේවා එකිනෙකට සම්බන්ධ කරුණුය. පසුගිය කාලය පුරා සිය විධායක බලතල පවා අත් හරිමින් පාර්ලිමේන්තුවට ආණ්ඩුකරණය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේ වැඩි වගකීමක් පවරමින් ඔහු සිදු කළේ ආර්ථිකයත් දේශපාලනයත් සමබරව තබා ගනිමින් රට බංකොළොත්භාවයෙන් මුදවා වඩා හොඳම තීන්දු තීරණ මඟින් ජනතාවගේ අභිලාෂයන් යථාර්ථයක් කිරීම විය යුතු නිසාය. රට මේ මොහොතේ පවතින්නේ බල දේශපාලනයේ පිස්සු කෙළිම්වලට ඉඩදිය යුතු අවස්ථාවක නොවේ. ආණ්ඩුවත් විපක්ෂයක් වඩාත් වගකීම් සහගත වෙමින් රට සුරක්ෂා කරගත යුතු තැනකය. නමුත් විපක්ෂයට එලෙස අපේක්ෂාවක් නැති බව ඔවුන්ගේ පටු අවස්ථාවාදී කියුම් කෙරුම්වලින් අදත් ඔප්පු කරමින් සිටින සත්‍යය වේ.

සෝෂක

# විපක්ෂයේ IMF නරිවාදමට Sorry

"කටේ නරිවාදන් රෙද්ද පල්ලෙන් බේරෙනවා" කියා කියමනක් ඇත. ඒ වචන පරිස්සම් කර නොගැනීම නිසා සිදුවන නින්දාව ගැන පහදන්නටය. සතිය අවසානයේ විපක්ෂයට අත්වූයේ එවැනි තත්වයකට මුහුණ දීමටය. ඒ IMF විස්තීර්ණ ණය පහසුකමෙහි දෙවැනි වාරිකය ලබාගැනීම සම්බන්ධව සහ මෙරට විදෙස් ණය ප්‍රශස්තකරණය සම්බන්ධව කරපු කියපු කතා නිසාය.

ඊට උදාහරණ ලෙස මේ ගැන නරිවාදන් හාදයන් දෙදෙනෙක් හොඳටම ප්‍රමාණවත් ය. එයින් එක් අයෙකු නම් විපක්ෂ නායක සජිත්ය. අනෙක් කෙනා ජවිපෙ - ජාජබ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත්ය.

දිනෙන් දින හීනවන වෙන්ඩ ජනාධිපති හීනයෙන් ආතුරව සිටින විපක්ෂනායකවරයා දැන් දේශපාලනය කරන්නේ පාසල්වලය. ඒ ගිහින් කියන බොරු ලැයිස්තුවේ පසුගිය කාලයේ උඩින්ම තිබුණේ IMF විස්තීර්ණ ණය පහසුකම යටතේ ලැබීමට දෙවන වාරිකය ප්‍රමාදවීම ගැනය. පසුගිය දිනක පිටිසරබද පාසලකට ගිය විපක්ෂනායක එහිදී කියන්නේ, ආණ්ඩුවේ ප්‍රායෝගික නොවන ප්‍රතිපත්තිය පිළිබඳව IMF සංවිධානය පවා කණස්සල්ලට පත්ව ඇති බවය. රාජ්‍ය ආදායම් ඉලක්ක වෙත ළඟා වීමට ආණ්ඩුව අපොහොසත්ව ඇති පසුබිමක IMF විසින් ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිත දෙවැනි වාරිකය මුදා හැරීම අත්හිටුවා ඇති බවය.

විපක්ෂ නායක එහෙම කියන විට මන්ත්‍රී විජිත හේරත් පාර්ලිමේන්තුවේදී කිව්වේ, ලෝකයේ රටවල්වල රස්තියාදු ගැහුවාට රටේ විදේශ ණයවලින් එක ඩොලර් එකක් වත් තවම කපා ගෙන නැති බවය. ෂී ජින් පිං එක්ක පොටෝ එකේ මැද හිටගෙන හිටියාට ණය සතයක්වත් කපා ගන්නට නොහැකි වී ඇතැයි ද කීවේය. අදට වඩා හෙට හොඳයි කියා හැමදාම කයිවාරු ගහන බවත් අවුරුදු එකහමාරක් තිස්සේ වෙච්ච දෙයක් නැති බවත් කිව්වේය.

වැඩේ කියන්නේ මේ නරිවාදන්වලට මේ සතිය ඇතුළේම හැරෙන තැපෑලෙන් ප්‍රතිචාර ලැබීමය. එයත් ආණ්ඩුව පැත්තෙන් නොව, අනෙක් පාර්ශ්ව වෙතින්ම ලැබීමය.

විපක්ෂ නායක සජිත් පච කියමින් පාසල් ළමුන් රවටමින් සතුටු වෙන අතරේ ජාත්‍යන්තර මුල්‍ය අරමුදල විසින් නිවේදනය නිකුත් කළේය. ඒ ශ්‍රී ලංකාවට ලබාදෙන ඩොලර් බිලියන 03ක මාස 48ක විස්තීර්ණ ණය පහසුකමට අදාළව ක්‍රියාවට නංවා ඇති වැඩසටහන පිළිබඳ සිදුකරන ලද පළමු සමාලෝචනයෙන් පසු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායම සහ ශ්‍රී ලංකා බලධාරීන් අතර කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට පැමිණි බවය. ඒ IMF කළමනාකාරිත්වය සහ IMF විධායක මණ්ඩලයේ අනුමැතියට යටත්වය. ශ්‍රී ලංකාව සඳහා වූ IMF ජ්‍යෙෂ්ඨ දූත මණ්ඩල ප්‍රධානී පීටර් බෘවර් සහ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානී විසින් මෙම නිවේදනය නිකුත්කර ඇති අතර ඒ මෙරට වගකිව යුතු පාර්ශ්ව සමඟ පැවති සාකච්ඡාවලින් අනතුරුව සහ මොරොක්කෝහි පැවති වාර්ෂික රැස්වීම් අතරතුරදීය.

ඒ අනුව IMF කළමනාකාරිත්වය සහ IMF විධායක මණ්ඩලය විසින් සමාලෝචනය අනුමත කළ පසු ශ්‍රී ලංකාවට දෙවන වාරිකය ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 330ක් හිමි වීමට නියමිතය. එසේ වුවහොත් ශ්‍රී ලංකාවට ලබා දී ඇති මුළු ණය මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 660ක් දක්වා ඉහළ යන්නේය.

IMF නිකුත් කළ නිවේදනය වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙරට සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රතිසංස්කරණ පළ දැරීමට පටන් ගෙන ඇති බවත් ආර්ථිකය ස්ථාවර වීමේ තාවකාලික ලකුණු පෙන්නුම් කරන බවත් ය. ආණ්ඩුව එදිනෙදා ප්‍රතිසංස්කරණ ගම්‍යතාව තිරසාරව පවත්වා ගැනීම සහ පරිපාලන දුර්වලතා සහ දූෂණ අවදානම්වලට නිසි විසඳුම් ලබාදීම, ආර්ථිකය කල්පවත්නා ප්‍රකෘතියක් සහ ස්ථාවර වර්ධනයක් කරා යන මාවතකට ගෙන ඒම සඳහා ඉතා වැදගත් වන බවද එහිදී අවධාරණය කර ඇත.



එසේම ඉදිරි කාලය තුළ, අදාළ සියලුම පූර්ව ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාත්මක කළ යුතු වන අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීම් කාලානුරූපීව සහ වැඩසටහනෙහි ණය ඉලක්කවලට අනුකූලව අවසන් වනු ඇති බවට විශ්වාසයක් ඇති කිරීම තහවුරු කළ යුතුව ඇත. විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සඳහා ශ්‍රී ලංකා බලධාරීන් කැපවී සිටින අතර, ඔවුන්ගේ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් ප්‍රශංසනීය බවද IMF සිය නිවේදනයෙහි සඳහන් කර ඇත්තේය.

එසේම උද්ධමනය 2022 සැප්තැම්බර් මාසයේදී සියයට 70ක උපරිමයේ සිට 2023 සැප්තැම්බර් මාසයේදී සියයට 1.3 දක්වා පහත වැටී ඇත. මේ වසරේ මාර්තු-ජූනි කාලය තුළ දළ ජාත්‍යන්තර සංචිත ඩොලර් බිලියන 1.5 කින් ඉහළ ගොස් ඇත. අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය ද අඩු වී ඇත.

අවශ්‍ය බදු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම, බදු පරිපාලනය ශක්තිමත් කිරීම සහ බදු පැහැර හැරීම් සක්‍රීයව තුරන් කිරීම මඟින් ආදායම් ඉහළ නැංවීමට සහ වඩා හොඳ පාලනයක් සඳහා වන බලධාරීන්ගේ කැපවීම අගය කරන බවද ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සඳහන් කර ඇත. ශ්‍රී ලංකා බලධාරීන් දේශීය ණය ක්‍රියාකාරිත්වය අනුගමනය කරමින්, තීරණාත්මක ඊළඟ පියවර වන්නේ IMF විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද වැඩසටහන් පරාමිතීන්වලට යටත්ව සහ ණය ඉලක්කවලට අනුකූලව, ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් නිල ණය හිමියන් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමය. ශ්‍රී ලංකාව සහ චීනයේ අපනයන-ආනයන බැංකුව අතර ඇති තාවකාලික ගිවිසුමක් පිළිබඳව තම අවධානය යොමුව ඇති බවත් එය ලැබුණු පසු තොරතුරු විශ්ලේෂණය කිරීමට බලාපොරොත්තු වන බවත් ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සඳහන් කර ඇත.

තවද ජාත්‍යන්තර මුල්‍ය අරමුදල ශ්‍රී ලංකාවේ සියලුම නිල ණය හිමියන්ගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන් සපයන ලද මූල්‍ය සහතිකවලට අනුකූලව සුදුසු ණය ගෙවීම් ක්‍රමවේදයක් අනුව ඉදිරියට යාමට එකඟ වන ලෙසය. වාණිජ ණයහිමියන් සහ ශ්‍රී ලංකාව අතර සාකච්ඡා සිදුවෙමින් පවතින බව තමන් වටහාගෙන ඇති අතර ශක්තිමත් ලෙස ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අවශ්‍යතාවයද IMF විසින් අවධාරණය කර ඇත.

IMF එහෙම කියන විට පසුගියදා මොරොක්කෝවේ, මරකේෂ් හී පැවැත්වෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ වාර්ෂික සමුළුවට සමගාමීව පැවැත්වූ මාධ්‍ය හමුවක් අවස්ථාවේ එහිදී ඉන්දීය මුදල් අමාත්‍ය නිර්මලා සීතාරාමන් ද මෙසේ සඳහන් කර තිබිණ.

"ශ්‍රී ලංකාව දුෂ්කරතාවයට මුහුණ දෙද්දි එය මැදි ආදායම් ලබන රටක්. නමුත් කොවිඩ් බලපෑම් සහ ඇතිවූ අස්ථාවරයන් හමුවේ එම තත්ත්වය පහතට වැටුණා. ශ්‍රී ලංකාව අඩු ආදායම් ලබන රටක් බවට පත්වුණා. මැදි ආදායම් රටක් වූ ශ්‍රී ලංකාව මුහුණ පෑ අර්බුදය නිසා එය පොදු රාමුවක් තුළ විසඳාගත නොහැකි තත්වයක් බවට පත්වුණා. ඒ නිසයි පොදු රාමුවක් තුළ මෙම අර්බුදය ආමන්ත්‍රණය කිරීමට සුදුසුකම් ලැබිය නොහැකි තත්ත්වයකට පත්වුණේ.

මම සිතන්නේ අනෙක් බොහෝ ඒවාට සාපේක්ෂව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරහා ශ්‍රී ලංකාව ලබාගන්න විසඳුම් ඉතා යහපත් මට්ටමක පවතිනවා වගේම ඉතා වේගවත්. මම අන් අයට එරෙහිව පොදු රාමුව ගැන තීන්දුවක් ලබාදෙන්නේ නැත. නමුත් පොදුවේ අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ තවත් බොහෝ ආයතනවල එම ක්‍රම්වේදය වේගවත් විය යුතු බවට පැවැසෙනවා. එහිදී ශ්‍රී ලංකාවේ යෝජනා වඩා වේගයෙන් සිදුවෙමින් පවතිනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ හා ඉන්දීය සභාපතිත්වය හිමි ලෝක බැංකුව සමඟ ස්වෛරීත්ව ණය සම්බන්ධයෙන් ණයහිමි කමිටු පිහිටුවීමේදී, ශ්‍රී ලංකාවේ ණය අර්බුද ගැටලුව පිළිබඳව අප සාකච්ඡා කළා. ඒ වගේම එම තත්වය ඉදිරි අනාගතයේ ඕනෑම රටක් සඳහා යොදාගත හැකි ආකාරයෙන් සැලකිල්ලට ගත යුතුයි. එම ක්‍රමවේදය මගින් ඉතා වේගවත් ලෙස විසඳුම් ලබාදෙමින් ක්‍රියාවට නැංවිය හැකි බවයි මම සිතන්නේ."

ඉන්දියාව කියන්නේ මෙරට ප්‍රධාන ණය හිමියෙක්ය. මෙරට ප්‍රධාන ණය හිමියෙක් එසේ කියන විට, මෙරට විපක්ෂ නායක සජිත්, පාසල් දරුවන් හමුවේ කියන්නේ "බදු ගැසීමෙන්ම පමණක් රාජ්‍ය ආදායම වැඩි කරන්න බැහැ. ඒ සඳහා රට තුළ ආදායම් උත්පාදනය කළ යුතුයි. එහෙත් වර්තමාන ආණ්ඩුව සිදු කරන්නේ ආර්ථිකය හකුළුවමින්, ජනතාවගේ සුළු, සුළු ප්‍රශ්නවලට තාවකාලික විසඳුම් සෙවීමයි." කියාය. ඒ අනුව විපක්ෂ නායකගේ ඉස්කෝල පචවල තරම තේරුම් ගැනීම දුෂ්කර නැත. සැබවින්ම විපක්ෂ නායකගේ ඉස්කෝල පච පෙනුමෙන් ආණ්ඩු විරෝධී බව ඇත්තය. නමුත් ඒ ප්‍රකාශවල හරයේ ඇත්තේ මේ රට ඉතිහාසයේ මුහුණදුන් දරුණුම ආර්ථික අර්බුදයෙන් ගළවා ගැනීම සම්බන්ධයෙන් වන වෛරයක් ය. ඒ වෛරය තවත් උත්සන්නව ඇත්තේ තමන් වගකීම පැහැර හැර පළාගිය අවස්ථාවේ වගකීම බාරගත් ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ නායකත්වය මධ්‍යයේ රට ගොඩ ගැනීමය.

විපක්ෂ නායක පමණක් නොව **"ලෝකය වටේ ගියාට එක ඩොලරයකින් ණය අඩු කරගත්තද?"** අහන ජවිපෙ-ජජබ විජිතලාද තවදුරටත් සියලු නපුරන් වපුරමින් ජනප්‍රිය දේශපාලනයේ නිරත වන්නේ මේ රට ගොඩනගන වැඩපිළිවෙල අඩපණ කිරීමටය. ඒ හරහා බලය ගන්නටය. බලය ගත්තට පස්සේ කරන දේ ගැන වැඩපිළිවෙලක් ද ඔවුන්ට නැත. සැබවින්ම ජනාධිපති රනිල්ගේ වැඩපිළිවෙල වෙනුවට විකල්පයක් විපක්ෂයට නැත. ඔවුන් කරන්නේ විවිධ වචන තෝරන් මඟින් තම අඩුව වසා ගෙන වාසිය ගන්නට බැලීමය. එහි අවසානය මිලියන 22ක් වන මෙරට ජනතාවගේ ඉරණම ආර්ථික සුසානයකට ගෙනයාමට බව යන්න ගැන නම් කවුරුත් කුකුසක් තබා ගත යුතු නැත.

කෙසේ හෝ වේවා විපක්ෂය කොතරම් නපුරු සිහින දැක්කත් වත්මන් අර්බුදයෙන් රට ගොඩගෙන ස්ථාවර ආර්ථිකයක් ඇතිකිරීමට අදාළව ජනාධිපති රනිල් වික්‍රමසිංහ ගෙන යන වැඩපිළිවෙලෙහි සාර්ථකත්වය යළි යළිත් තහවුරු වෙමින් තිබීම රටේ මෙන්ම මිලියන 22 ක මෙරට ජනතාවගේද වාසනාවය. ඒ කියන්නේ හෙට විපක්ෂය කියන ආකාරයට නම් කොහෙත්ම අඳුරු නොවන බවය. ඒ ගැන තහවුරු කෙරුණේ 3 වන "එක් තීරයක් - එක් මාවතක්" ජාත්‍යන්තර සමුළුවට සහභාගී වීමට චීනයට ගිය ජනාධිපතිවරයා, චීන මුදල් අමාත්‍යවරයා හමුවූ අවස්ථාවේ ය.

එහිදී චීන මුදල් අමාත්‍යවරයා පැහැදිළිවම සඳහන් කර සිටියේ ශ්‍රී ලංකාවේ ණය ප්‍රශස්තකරණය උදෙසා දෙපාර්ශ්වයටම සරිලන මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට චීනය පූර්ණ සහාය ලබාදීමට චීනය සූදානම් බවය. ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින ආර්ථික අභියෝගය පිළිබඳ මනා අවබෝධයක් චීනයට තිබෙන බව මෙහිදී පැවසූ චීන මුදල් අමාත්‍යවරයා එම අර්බුදයෙන් ගොඩඒම උදෙසා ශ්‍රී ලංකාව මෙතෙක් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ද ඇගයීමට ලක් කළේය. එසේම ශ්‍රී ලංකාව සහ චීනය අතර මූල්‍ය හුවමාරු කාර්යයන් සම්බන්ධයෙන් ද මෙහිදී දීර්ඝ ලෙස අදහස් හුවමාරු කර ගැනීම සිදු වූ අතර චීනය සමඟ සමීපව කටයුතු කරන වෙනත් ජාත්‍යන්තර ආයතන වෙතින් ශ්‍රී ලංකාවට සහාය ලබාදන ලෙස ඉල්ලා සිටින බවද චීන මුදල් අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

එපමණක් නොව එම සංචාරයේ දී චීන ජනාධිපති ෂී ජින් පිං හමුවූ අවස්ථාවේ ඔහුද සහතික කර සිටියේ ශ්‍රී ලංකාවේ ණය ප්‍රශස්තකරණ වැඩපිළිවෙළ උදෙසා සුහද, ප්‍රායෝගික හා කඩිනම් සහාය ලබාදීමට චීනය කටයුතු කරන බවටය. එපමණක් නොව ශ්‍රී ලංකාවේ ස්ථාවර ආර්ථිකයක් නිර්මාණය කර ගැනීම සඳහා කිසිඳු දේශපාලනික අරමුණකින් තොරව සහාය ලබාදීමට චීන මහජන සමූහාණ්ඩුව කටයුතු කරන බවත්, ජනාධිපති රනිල් වික්‍රමසිංහ සමඟ සමීපව කටයුතු කිරීම තම අරමුණ බවත් ඔහු සඳහන් කළේය.

එක්සත් ජාතීන්ගේ මහ මණ්ඩල සමුළුවේ දී ජනාධිපති රනිල් වික්‍රමසිංහ සිදු කළ කතාව මඟින් ශ්‍රී ලංකාවේ උපායමාර්ගික ස්වාධීනත්වය පිළිඹිබු වූ බවද සඳහන් කළ චීන ජනාධිපතිවරයා ශ්‍රී ලංකාව දරණ මධ්‍යස්ථ ස්ථාවරය ද ඇගයීමට ලක් කළේය.

එසේම ජනාධිපති රනිල් වික්‍රමසිංහ දැවැන්ත අර්බුදයකට ලක්ව සිටි ලාංකිය සමාජය ඉන් මුදවාගෙන සංවර්ධන මාවතකට යොමු කර ඇති බවද ඔහු සඳහන් කළේය. ජනපති රනිල්ගේ රට ගොඩනගන වැඩසටහනට අදාළ චීන ප්‍රතිචාරය එසේය. ඒ කියන්නේ පැරිස් සමාජය, චීනය මෙන්ම ඉන්දියාව යන මෙරට ප්‍රධාන ණය හිමියන් වෙතින් ණය ප්‍රශස්තකරණයට අදාළ එකඟතා ලබාගැනීමට ජනාධිපති රනිල් සමත්ව ඇති බවය. දැන් ඇත්තේ මෙතැනින් ඉදිරියට යන්නය. ඒ හමුවේ පුදුම විය යුතුව ඇත්තේ විපක්ෂයේ නරි වාදන් රෙද්ද පළලෙන් නොබේරුනොත් නොවේද?

**කුසල් ජයම්පති**

Mr. President

# චීන ගමනෙන් බලාපොරොත්තු ගොන්නක් මෙරටට



චීන සංචාරයට පෙර දින සවස් භාගය වනතුරුත් ජනපති රනිල් වික්‍රමසිංහ සිටියේ ජනපති කාර්යාලයේ ය. ඒ යොදාගත් සාකච්ඡා ගණනාවක් හේතුවෙනි. ඉරුදින පස්වරුවේ ජනපති රනිල් මුණ ගැසීමට ආවේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ නියෝජිතයන් පිරිසක් හා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නියෝජිතයන් පිරිසකි.

නියෝජිතයන් තමන්ගේ ගැටළු ජනපතිට ඉදිරිපත් කළේය. විශ්ව විද්‍යාල ආචාර්යවරු විසින් ඔවුන්ගේ ගැටළු ඉදිරිපත් කිරීමෙන් පසු ජනපති රනිල් ඔවුනට හිමි අධ්‍යයන දීමනාව ගෙවීමට එකඟ වූහ. එය ඉදිරි අයවැයෙන් නිවැරදි කිරීමට ද පොරොන්දු වූවේය.

වෛද්‍යවරුන්ගේ රාජකාරී පැය ගණන පිළිබඳව වන ගැටළුව ද විසඳීමට පොරොන්දු වූ ජනපති දෙපාර්ශවයේම පොදු යෝජනාවක් වූ බදු ගැටළුව විසඳීමට ද එකඟතාවය පළ කළේය. සාකච්ඡා දෙකම සුහදශීලිව අවසන් වූවේ කාටත් එකඟවිය හැකි මතයකට පැමිණීම නිසාය.

ඉන් පසු ජනපති රනිල් එජාප පක්ෂ සම්මේලනය ගැන මහලේකම් රංගේ ඇතුළු පිරිස සමඟ කතා බහක ද නිරත වූවේය. 19 වන සිකුරාදා සවස චීන සංචාරය නිමවා පැමිණෙන බව දැනුම් දුන් ජනපති සෙනසුරාදා සවස සම්මේලනයට සහභාගී වන බව ද කියා සිටියේය.

සියළු කටයුතු අවසන් කළ ජනපති එදින රාත්‍රියේම චීනය බලා පිටත්ව ගියේ ඇමතිවරු කිහිප දෙනෙකු ද එකතු කර ගනිමිනි. විදේශ ඇමති අලි සබ්‍රි, ජනමාධ්‍ය ඇමති බන්දුල ගුණවර්ධන, ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක, මහ බැංකු අධිපති නන්දලාල් වීරසිංහ හා ආයෝජන මණ්ඩලයේ සභාපති දිනේෂ් වීරක්කොඩි යන අය මේ ගමනට එක්ව සිටියහ.

## එක් තීරයක් - එක් මාවතක්, ප්‍රතිලාභ රැසක්

චීනයේ පැවැත්වෙන ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වන 03 වන " එක් තීරයක් - එක් මාවතක්" සමුළුව 16 දා සිට 20 දා දක්වා පැවැත්වුණු අතර චීන රජයෙන් ලද ආරාධනාවකට අනුව ජනපති රනිල් මේ සංචාරයට එක්විය.

සඳුදා සිය පළමු හමුව ලෙස ජනපති රනිල් චීනයේ ආයෝජන, වෙළෙඳ හා සංචාරක සැසියකට එක්වූවේය. චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ මෙම හමුව සංවිධානය කර තිබුණි. ශ්‍රී ලංකාවේ ආයෝජනයට එක්වන ලෙස ජනපති රනිල් මෙහිදි චීන ව්‍යාපාරිකයන්ගෙන් ඉල්ලා සිටියේය.

එක් තීරයක් - එක් මාවතක් සමුළුවට සහභාගීවීමට චීනයට පැමිණ සිටි ඉන්දුනිසියානු ජනාධිපති ජෝකෝ විඩොඩෝ හමුවූ ජනපති රනිල් ඔහු සමඟ ද්වි පාර්ශවික සාකච්ඡා පැවැත්වූහ. ජනපති රනිල් චීනයේ සේම ලෝකයේ ප්‍රබලතම තොරතුරු තාක්ෂණික සහ සංනිවේදන සමාගමක් වන හුවාවි සමාගමේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූවේ අගහරුවාදා පෙරවරුවේය. පාසල් දරුවන් වෙනුවෙන් නව තාක්ෂණික පහසුකම් සලසා දීම සම්බන්ධයෙන් හුවාවි සමාගම හා එක්ව විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අදාළ ගිවිසුමකට ද මෙහිදි අත්සන් තැබීනි.

මේ අතර චීන සමුළුවට සහභාගීවීමට පැමිණ සිටින පකිස්ථානු අග්‍රාමාත්‍ය අන්වාර් උල් හක් සමඟ ද ජනපති රනිල් සාකච්ඡාවක නිරත වූවේය. ආර්ථික අර්බුදයෙන් මිදෙනාකාරය ගැන ද මෙහිදි සාකච්ඡා කර තිබේ. මීට පෙර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහය පකිස්ථානයට ලබාගැනීම වෙනුවෙන් ජනපති රනිල්ගෙන් උපදෙස් ලබාගැනීමට පකිස්ථානය කටයුතු කර තිබිණි.

මෙහිදී ජනපති රනිල් වියට්නාම ජනාධිපති වෝ වැං තොන්ග් සමඟ ද ද්වි පාර්ශ්වික සාකච්ඡා පැවැත්වූවේය. දෙරට අතර ආර්ථික හා සමාජීය දියුණුව ගැන මෙහිදි අදහස් හුවමාරු වූවේය.

## සුදු තුරඟ විහාරයේ ලාංකේය සළකුණ

මෙම සමුළුව අතරවාරයේදී බ්‍රහස්පතින්දා දින චීනයේ මුල්ම බෞද්ධ සිද්ධස්ථානය ලෙස සැලකෙන හිනන් පළාතේ "සුදු තුරඟ" විහාරස්ථාන පරිශ්‍රය වෙත් යෑමට ජනාධිපතිවරයා පියවර ගෙන තිබිණි. "සුදු තුරඟ" විහාරස්ථානයේ විහාරාධිපති යින් ලී හිමිපාණන් සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ අතර වූ කතා බහේදී ශ්‍රී ලාංකේය පාරම්පරික ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිඹිබු කෙරෙන විහාර මන්දිරයක් සහ ස්ථූපයක් ඉදි කිරීමේ කාර්යය කඩිනමින් ආරම්භ කරන බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ පොරොන්දු විය. "සුදු තුරඟ" විහාර සංකීර්ණයේ ලාංකේය විහාර මන්දිරයේ ඉදිකිරීම් සංකල්පය රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍ය ධූරය දරන සමයේ ක්‍රියාවට නැංවීමට කටයුතු කර තිබු නමුත් පසුකාලීනව එහි වැඩකටයුතු ක්‍රියාත්මක නොවීය.



## පොලිස්පති පත් කිරීම

රනිල්ට පොලිස්පතිවරයාගේ පත්වීම ව්‍යවස්ථාදායක සභාව අනුමත කොට නොමැති බවට පණිවුඩය දුන්නේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දිනිත් චින්තකය. ජනපති රනිල් මේ ගැන වහාම සොයා බැලූ අතර ජනපතිවරයාත්, පොලිසිය බාර ඇමතිවරයාත් ලංකාවේ නොමැති අවස්ථාවේ එවැනි තීරණයක් ගැනීම ගැන ජනාධිපතිවරයා කණගාටුව පළ කළේය.



එසේම ජනපතිවරයා මේ ගැන සොයා බලද්දී තවත් පාර්ශ්ව ගණනාවකින් දැනගැනීමට ලැබුණේ රටේ ජනාධිපතිවරයා නොමැති අවස්ථාවක මෙම තීරණය ගනු ලැබුවේ රට අස්ථාවර කිරීමට බවය. එසේම කුඩු මුදලාලිලා ආරක්ෂා කිරීමට මෙම තීන්දුව ගත්තේ ද යන සැකය ද මෙහිදි මතුව තිබිණි.

අවසානයේ ජනපති රනිල් සිය ලේකම් සමන් ඒකනායකට දැනුම් දුන්නේ පොලිස්පතිවරයා ලෙස යළිත් සති 03 ක කාලයකට සී.ඩී වික්‍රමරත්න වහාම පත් කරන ලෙසය. ව්‍යවස්ථාදායක සභාව වෙත යළිත් එම පත්වීම යවන ලෙස ද ඔහු උපදෙස් දුන්නේ ලේකම් සමන්ටය.

## චීන රජයෙන් පොරොන්දු රැසක

"එක් තීරයක් එක් මාවතක්" සමුළුව චීන ජනපති ෂී ජින් පින්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වූවේ බදාදා ය. අට වැදැරුම් ප්‍රතිපත්ති මාලාවක් චීන ජනාධිපතිවරයා මෙහිදි එළි දැක්වූ අතර රාජ්‍ය නායකයන් සමුළුවට කැදවාගෙන ආවේ උත්තමාචාර මැදිනි. සමුළුවේ ආරම්භයෙන් පසු රාජ්‍ය නායකයන් ජනපති ෂී ජින් පින් සමඟ සමූහ ඡායාරූපයකට ද පෙනී සිටියේය.

"එක් තීරයක් එක් මාවතක්" ජාත්‍යන්තර සමුළුවට සමගාමීව පැවැති "ස්වභාවික සුසංයෝගය වෙනුවෙන් හරිත සේද මාවත" සම්මන්ත්‍රණය ද ජනපති රනිල් ඇමතුවේය.

එහිදි දේශගුණික විපර්යාස කලාපයට බලපාන ආකාරය ගැන ජනපති කරුණු පැහැදිලි කර දුන්නේය. ජනපති රනිල්, චීන මුදල් ඇමති ලී යූ කුං මුණ ගැසුණේ බ්‍රහස්පතින්දාය. ලංකාවේ ලොකුම ණය හිමියා වන චීනයේ මුදල් ඇමති මුණ ගැසීම මෙරටට විශාල බලාපොරොත්තු ගොන්නක් ගෙනෙන හමුවක් වූවේය.

බලාපොරොත්තු වූ ලෙසම චීන මුදල් ඇමතිවරයා කීවේ මෙරට ණය ප්‍රශස්තකරණ වැඩසටහනේදි දෙපාර්ශවයටම සරිලන පරිදි මධ්‍ය කාලීණ හා දිගු කාලීන වැඩපිළිවෙලකට චීනය සහාය දක්වන බවය. එදිනම ජනපති රනිල් ප්‍රධාන පෙළේ චීන සමාගම් කිහිපයක නියෝජිතයෝ මුණ ගැසුණේය. ඒ අතර චීන සන්නිවේදන හා ඉදිකිරීම් සංස්ථාව, සිනොපෙක් සමාගම, ඊශෘ සමාගම ද විනි. වරාය නගරයට ආයෝජන ගෙන ඒමට මෙම සාකච්ඡාවේදි සමාගම් නියෝජිතයෝ ජනපතිට පොරොන්දු වූහ.

චීන ජනාධිපති ෂී ජින්පිං සමඟ ජනාධිපතිවරයා සිකුරාදා උදැසන බීජිං හී දී ද්විපාර්ශ්වික සාකච්ඡාවකට සහභාගී විය. මෙම සාකච්ඡාව මෙරටට බොහෝ සාධනීය ප්‍රතිපළ ගෙන ඒමට සමත්ව තිබිණි. මෙහිදී දේශපාලන කොන්දේසිවලින් තොරව මෙරටට ආධාර ලබා දීමට සහ මෙරට අපනයනයන් වලින් වැඩි ප්‍රමාණයක් මිළදී ගැනීමට චීනය කැමැත්තෙන් සිටින බවත් චීන ජනාධිපතිවරයා පැවසීය. එසේම ජාත්‍යන්තර සහ කලාපීය කටයුතු සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමටත් දෙරට අතර ශක්තිමත් හවුල්කාරිත්වයක් සහ සහයෝගයක් පවත්වාගෙන යාමටත් නායකයන් පොරොන්දු කරගෙන තිබිණි.

සිකුරාදා මෙරටට පැමිණි ජනපති රනිල් සෙනසුරාදා සවස සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණය පැවැත්වෙන එක්සත් ජාතික පක්ෂ විශේෂ සමුළුවට එක් විය.

Mediaman



# තියෙන දෙයකින් වැඩක් ගැනීමේ ක්‍රමෝපාය

රට හැදීම ගැන කප්පරක් කතන්දර උප්පත්තියේ සිටම මරණය දක්වාම මේ රටේ මෙතෙක් විසූ සෑම පුරවැසියකුම අසා ඇත. දැනටත් වාසය කරමින් සිටින පිරිසටද සිය මරණය දක්වා එසේ අසන්නට සිදුවෙනවාටත් සැක නැත. එසේම අනාගත පරපුරටද ඒ කතන්දර අසන්නට සිදුවිය හැකිය. නමුත් ඒ කියන රට හැදෙන්නේ නැත. මේ නිසා අපිට දුන්නොත් රට හදනවා කියන දේශපාලනයේද අවසානයක් නොවනු ඇත. පසුගාමී විදිහට කල්පනා කළහොත් මේ තත්වය ඇත්තය.

නිදහසෙන් පසු යුගය ගැන තිබෙන චෝදනාව වන්නේ රට කවුරුවත් හැදුවේ නැතැයි කියන එකය. රට බංකොලොත්වීමෙන් ඒ චෝදනාව තහවුරු වී ද ඇත. නමුත් රට නොහැදුනා නොව හැදුනු තරම් ප්‍රමාණවත් නොවීම මේ චෝදනාවට හේතුවය. අනෙක පෞද්ගලික වශයෙන් වන පීඩාවන් නිසා පොදු චෝදනාවක් ලෙස රට නොහැදීම ලෙස ගොනුව ඇතැයි කීමත් වැරදි නැත. කොහොම නමුත් සිදුව තිබෙන දේ අනුව, රට ගොඩනැගීම කළ නොහැකි යැයි නිගමනයකට පැමිණෙන්න හේතුවක් නොවේ. රට ගොඩනැගිය හැකිය. ඊට අවස්ථාවන් සහ හැකියාවන් තවම තිබේ. නමුත් ඒ භාවිත කිරීම සම්බන්ධයෙන් රටම සිටින්නේ අතිශය දුර්වල තැනකය. රටේ අසමත්භාවය නම් එයය.

සත්‍ය ලෙසම මේ රටට සිදු වුයේ, රට හදන්න පුළුවන් මාර්ගය අත්හැර දමා අයාලේ යෑමය. එය අනවබෝධයන් නිසා හෝ අනෙක් වුවමණාවන් වෙනුවෙන් රටේ අනාගතය නොතකා හැරීමක් හෝ නිසා සිදුවූ ස්වයං කෙලවාගැනීමක් බව කීම කිසිසෙත්ම වැරදි නැත. රටක් හැදීම, ගොඩනැංවීම නැතිනම් සංවර්ධනය කිරීම යනු සරල සංසිද්ධියක් නොවේ. විශේෂයෙන්ම මේ දූපත තුළ වසර දහස් ගණනක ඉතිහාසයේ රට හැදීම යනුවෙන් කල්පනා කළේ බත බුලතින් සරු, කිරියෙන් පැණියෙන් උතුරන රටක් ගැනය. රොමැන්තික කියවීම්ය.

කෘෂිකර්මාන්තය, පශු කර්මාන්තය, වාරි කර්මාන්තය ගොඩනැංවීමෙන් එහාට සිතුවේ නැති තරම්ය. අදත් මේක කෘෂිකාර්මික රටක්ය එය සංවර්ධනය කිරීමකින් හැර අනාගතයක් නැතැයි කියන කතාවෙන් ඔබ්බට වෙනකක් ගැන කල්පනා කිරීමත් විජාතික කුමන්ත්‍රණයක් කියන තැනටම බහුතරයේ සමාජ ආකල්ප ඝනීභූතව තිබේ. එහෙත් මේ රට, බත බුලතින්වත් කිරියෙන් පැණියෙන්වත් සමෘද්ධිමත් කිරීමට මේතාක් කාලයකට කිසිදු පාලකයකුට හෝ ජනතාවකට හැකිව නැත. ඇත්ත ඒකය. රට හදන්න කතා කරන අයත් කතා කරමින් සිටින්නේ මේ බත් බුලත් කිරි පැණි කෑම ගැනය. එහෙත් බඩ ගැන කල්පනාවෙන් එහා ලෝකයක් ගැන හිතන්න පුළුවන් වන්නේ දේශපාලනය බඩගෝස්තරය කරනොගත්ත මිනිස්සුන්ටය.

"**...ශ්‍රී ලංකාවේ අපට ආර්ථික වශයෙන් සුවිශේෂව තිබෙන්නේ භූගෝලීය පිහිටීම සහ මානව සම්පත පමණයි. අපට වෙන කිසිවක් නැහැ...**" ජනාධිපති රනිල් වික්‍රමසිංහ මේ කියන නිශ්චිත කතාව, පරම්පරා ගණනක් ඇදහූ, ලෝකෙන් උතුම් රට පිළිබඳ රෝමැන්තික කතන්දරවලට වඩා ඉදුරාම වෙනස්ය. නමුත් ඇත්තය. තේරෙන වචනවලින් කියන්නේ නම් පස්ස කහගන්නවත් නියපොත්ත නැතුවත් කරන පාරම්බෑම් ඕසෙට තිබුණා කියන එකය. මෙරට සංවර්ධනය සඳහා ගත යුතු මග සම්බන්ධයෙන් ජාත්‍යන්තර මට්ටමේ විද්වත් කතිකාව තුළ මේ අදහස අලුත් දෙයක් ද නොවේ.

රටෙන් එහා ලෝකයේ ආර්ථිකය ගැන, ඒ සම්බන්ධතා ජාලය ගැන අවබෝධය තුළ මෙරට භූගෝලීය පිහිටීම සහ මානව සම්පත උපාය මාර්ගිකව යොදාගැනීම තරමට වෙනත් සංවර්ධන ක්‍රමෝපායය කිසිවක් සාර්ථක නැති බව කෙතරම් සත්‍යයක් වුවත් ඒ රට තුළ ප්‍රයෝගිකත්වයට නැංවීමේ අභියෝගය අදත් ඇත. ඒ, පරණ ආකල්ප අත්හැරීමට ඇති සමාජීය හා දේශපාලනික නොහැකියාව සහ ඒ මතින් ගොඩයන්නට දඟලන පටු අවස්ථාවාදී දේශපාලනය නිසාය.

කොහොම නමුත් ජනාධිපතිවරයා, මෙරට භූගෝලීය පිහිටුම හා මානව සම්පත රටේ සංවර්ධනයේ ඉලක්ක වෙනුවෙන් යොදා ගතහැකි සුවිශේෂීම සාධක දෙක ලෙස නිශ්චිතවම හඳුනා ගනිමින් ඒ වෙනුවෙන් රටේ ආර්ථිකය හැඩ ගැස්සවීමට ගන්නා පියවර මෙරට සංවර්ධන ක්‍රමෝපාය සම්බන්ධයෙන් විශිෂ්ඨ පියවරයකි.

## භූගෝලීය පිහිටුමක උපාය

ලෝකයේම ඕනෑම රටක් තම භූගෝලීය පිහිටුම ගැන කල්පනා කළහොත් ඉන් අත්පත් කරගත හැකි ප්‍රතිලාභයන් තිබේ. එය රටකින් රටකට වෙනස් විය හැකි නමුත් අවස්ථාවන් විවෘතය. ඒ අනුව යම් රටකට ඛනිජ, පොසිල ඉන්ධන, කෘෂිකාර්මික ඉඩම්, ජල මූලාශ්‍ර, පුනර්ජනනීය බලශක්ති විභවයන් වැනි ස්වභාවික සම්පත් බහුලවීම මත එම රටට ආයෝජන ප්‍රවේශ වීමට එම භූගෝලීය පිහිටීම බලපෑ හැකිය. බහුල සම්පත් ඇති රටවලට ඇතැම් කර්මාන්තවලින් වාසියක් තිබිය හැකි අතර ආර්ථික වර්ධනය සඳහා ඒවා උපයෝගී කර ගත හැකිය. නිදසුනක් වශයෙන්, මැදපෙරදිග රටවල පොසිල ඉන්ධන නිස්සාරණය සහ අපනයනය වටා ඔවුන්ගේ ආර්ථිකයන් ගොඩනගා ඇත.

එමෙන්ම තවත් රටක භූගෝලීය පිහිටීමක් උපායමාර්ගික ස්ථානයකට ප්‍රවේශය සැපයිය හැකිය. එමඟින් රට ආර්ථික බලවතුන්ට ආකර්ශනීය වන අතර එමඟින් ආයෝජන සඳහා අවස්ථාව ලද හැකිය. ජාත්‍යන්තර වෙළඳාමේ යෙදීමට සහ ගෝලීය වෙළඳපොළ සමඟ සම්බන්ධවීමට රටකට ඇති හැකියාව කෙරෙහි ස්ථානීය බලපෑම් කළ හැකිය. ප්‍රධාන වෙළඳ මාර්ග, වෙරළ තීරයන් හෝ ප්‍රවාහන මධ්‍යස්ථාන අසල පිහිටි රටවලට වෙළඳපොළ වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි අතර එමඟින් වෙළඳ හා ආර්ථික අවස්ථා වැඩි වේ.

තවත් විටෙක භූගෝලීය පිහිටීමකට අනෙක් රටක ප්‍රහාරයක් හෝ ආක්‍රමණයක් වැලැක්විය හැකි අතර, එමඟින් ආර්ථික සංවර්ධනය සඳහා ආරක්ෂාව තර කරයි. තවත් භූගෝලීය පිහිටීමකට, ප්‍රදේශීය වශයෙන් හෝ ජනකොටස් අතර රටක සහජීවනය පවත්වාගත හැකි අතර එය ආර්ථික හා සමාජ සංවර්ධනයට හිතකර වේ.

එමෙන්ම භූගෝල පිහිටීම් රටක දේශගුණය, ස්වාභාවික විපත් සහ පාරිසරික තත්ත්වයන් කෙරෙහි බලපෑම් කළ හැකි අතර, එය සංවර්ධනය කෙරෙහි ධනාත්මක හෝ ඍණාත්මක බලපෑම් ඇති කළ හැකිය. හිතකර දේශගුණය සහ සාරවත් පස කෘෂිකාර්මික ඵලදායිතාවයට සහාය විය හැකි අතර කටුක දේශගුණය හෝ ස්වභාවික විපත්වලට ගොදුරු වීමේ අවදානම අභියෝග මතු කළ හැකිය. එසේම සෞන්දර්යාත්මක භූ දර්ශන, ඓතිහාසික ස්ථාන හෝ සංස්කෘතික ආකර්ෂණ ස්ථාන වැනි ලක්ෂණ සංචාරක ආකර්ෂණය කර ගත හැකි අතර, ආර්ථික සංවර්ධනයට දායක වේ.

මේ ආකාරයෙන් විවිධ ප්‍රතිලාභයන් අත්පත් කරගත හැකි නමුදු භූගෝලීය පිහිටීමම පමණක් රටක් සංවර්ධනය කෙරෙහි රඳා නොපවතින බවත් කිව යුතුය. නමුත් එය වැදගත්ම සාධකයකි.

රාජ්‍ය පාලනය, දේශපාලන ස්ථාවරත්වය, රාජ්‍ය ප්‍රතිපත්ති, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා, සංස්කෘතික හා සමාජීය සම්මතයන්, ආයෝජන සඳහා ප්‍රවේශය සහ යටිතල පහසුකම් වැනි පුළුල් පරාසයක වෙනත් සාධක ද රටක සංවර්ධනයට බලපායි. මීට අමතරව, බොහෝ රටවල් තාක්ෂණය සහ නව්‍ය චින්තනය භාවිතා කිරීම තුළින් ඔවුන්ගේ භූගෝලීය සීමාවන් ජය ගැනීමටත් සමත් වී ඇත. අවසාන වශයෙන්, රටක සංවර්ධනය යනු පුළුල් පරාසයක සාධක මඟින් බලපෑමට ලක්වන සංකීර්ණ සහ බහුවිධ ක්‍රියාවලියක් වන අතර භූගෝලීය පිහිටීම බොහෝ සලකා බැලීම්වලින් වැදගත්ම එකකි.

## රටක මහා ප්‍රාග්ධනය

එසේම ජනාධිපති රනිල් පෙන්වා දුන් අනෙක් කරුණ නම් මානව සම්පතය. එය රටක අභිවෘද්ධිය හැඩගැස්වීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මෙය රටක තිබෙන මහා ප්‍රාග්ධනයයි. එය ප්‍රබල ශක්‍යතාවයකින් යුතුව ගොඩනගා ගැනීමට නම් නිපුණ ශ්‍රම බලකායක් සිටිය යුතුය. එය සංවර්ධනය කිරීමට අධ්‍යාපනය, කුසලතා පුහුණුව සහ සෞඛ්‍ය සේවා සඳහා ආයෝජනය කිරීම විය යුතුය. මානව ප්‍රාග ්ධන සංවර්ධනයට ප්‍රමුඛත්වය දීමෙන් දක්ෂතා ආකර්ෂණය කරගැනීමට, රඳවා ගැනීමට, ව්‍යවසායකත්වය පෝෂණය කිරීමට සහ දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ගොඩ නැගීමට හැකිය. එමෙන් අද ලෝකයේ ප්‍රමුඛතම ඉල්ලුමක් මේ කුසලතා පුහුණු ශ්‍රමිකයන්ට, වෘත්තිකයන්ට තිබේ. ඒ අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට දායකවීම හරහා රටකට විදේශීය විනිමය වත්කම් උපයා ගැනීමේ උපක්‍රමශීලි ප්‍රවේශයකට යා හැකිය. මේ අනුව ඉහළ ගණයේ මානව සම්පතක් ගොඩනගා ගැනීම මඟින් මෙරට සංවර්ධනයේ ප්‍රධාන මෙවලමක් බවට එය පත්කරගැනීමේ පහසු අවස්ථාවක් ඇත.

## භූ පිහිටීමෙන් ගොඩගිය රටවල්

සිංගප්පූරුව- අග්නිදිග ආසියාවේ ප්‍රධාන නැව් මාර්ගවල සන්ධිස්ථානයේ උපාය මාර්ගික පිහිටීමෙන් නිසි ප්‍රතිපළ නෙලා ගත් සිංගප්පූරුව ලොව ප්‍රමුඛතම වෙළඳ හා මූල්‍ය මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වී ඇත. උසස් සැපයුම් යටිතල පහසුකම් සහ ව්‍යාපාරික හිතකාමී ප්‍රතිපත්ති විදේශ සමාගම් ආකර්ෂණය කරමින් ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සලසා ඇත. සිංගප්පූරුව තාක්ෂණය සහ මූල්‍ය සඳහා ගෝලීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ඇත. එමෙන්ම අද එය ලෝකයේ ප්‍රමුඛතම අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් බවට පත්කර ගැනීමේ හැකියාවද සම්පූර්ණ කරගැනීමට සමත්ව ඇත.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය - යුරෝපය, ආසියාව සහ අප්‍රිකාව අතර එහි උපාය මාර්ගික පිහිටීම විශේෂයෙන්ම ඩුබායි සහ අබුඩාබි, ප්‍රධාන ගෝලීය ව්‍යාපාරික සහ සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම සඳහා යොදාගෙන ඇත. එහි අති නවීන ගුවන්තොටුපළ, උසස්ම ගුවන් සේවා සහ නවීන යටිතල පහසුකම් සම්බන්ධතා සඳහා පහසුකම් සලසා ඇති අතර එය ජාත්‍යන්තර වෙළඳාම, ආයෝජන සහ සංචාරක ව්‍යාපාරය සඳහා වඩාත් කැමති ගමනාන්තයක් බවට පත් කර ඇත. එමෙන්ම මූල්‍ය, දේපළ වෙළඳාම්, සංචාරක සහ සැපයුම් වැනි අංශ කෙරෙහි අවධානය යොමු කරමින් තෙල් හා ගෑස්වලින් ඔබ්බට ආර්ථිකය විවිධාංගීකරණය කර ඇත.

නෙදර්ලන්තය එහි භූගෝලීය පිහිටීම යුරෝපයට පිවිසුම් මාර්ගයක් ලෙස භාවිතා කර ඇත. ලෝකයේ විශාලතම වරායක් වන රොටර්ඩෑම් වරාය ඇතුළු රටේ පුළුල් වරාය ජාලය, නෙදර්ලන්තය වෙළඳාම සහ ප්‍රවාහනය සඳහා අත්‍යවශ්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කර ඇත. මීට අමතරව, නෙදර්ලන්තය උසස් සැපයුම් පද්ධති, කාර්යක්ෂම ප්‍රවාහන යටිතල පහසුකම් සහ හිතකර ව්‍යාපාරික පරිසරයක් සඳහා ආයෝජනය කර ඇති අතර, බොහෝ ජාත්‍යන්තර සමාගම් ආකර්ෂණය කර ගනිමින් සැපයුම් සහ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත වී ඇත.

පැනමාව, පැනමාවේ ආර්ථික වර්ධනයට පැනමා ඇළ තීරණාත්මක සාධකයක් වී ඇත. මෙම ඇල අත්ලාන්තික් සහ පැසිෆික් සාගර සම්බන්ධ කරයි. ගෝලීය නැව්ගත කිරීම සහ වෙළඳාම සඳහා වැදගත් කෙටි මගක් සපයයි. පැනමාව විසින් විශාල යාත්‍රා ගමන් කිරීමට මෙන්ම එහි ධාරිතාව වැඩි කිරීමට ඇළ පුළුල් කිරීම සහ නවීකරණය කිරීම සඳහා දැවැන්ත ආයෝජනය කළේය. මෙය සමුද්‍ර වෙළඳාම ඉහළ නංවා ඇත, ජාත්‍යන්තර නැව් සමාගම් ආකර්ෂණය කර ඇත, සහ රටේ සැපයුම් සහ සේවා අංශ ශක්තිමත් කර ඇත.

කටාර්- අරාබි අර්ධද්වීපයේ ඊසානදිග වෙරළ තීරයේ පිහිටා ඇති කටාරය, ලෝකයේ ධනවත්ම රාජ්‍යයක් බවට පත්වීමට ස්වකීය ස්වාභාවික වායු (LNG) විශාල සංචිත ප්‍රාග ්ධනය කර ඇත. පර්සියානු ගල්ෆ් කලාපයේ එහි උපායමාර්ගික පිහිටීම ගෝලීය වෙළඳපොළවල් වෙත ද්‍රව ස්වභාවික වායු ප්‍රධාන අපනයනකරුවෙකු බවට පත් කර ඇත. කටාර් රාජ්‍යය නිෂ්පාදන පහසුකම් සහ නැව්ගත කිරීමේ හැකියාව ඇතුළුව

07 පිටුවට

06 පිටුවෙන්

LNG යටිතල පහසුකම් සඳහා විශාල වශයෙන් ආයෝජනය කර ඇති අතර එමඟින් එහි භූගෝලීය වාසිය ප්‍රයෝජනයට ගැනීමට සහ පිරිසිදු බලශක්ති ප්‍රභවයන් සඳහා වන ගෝලීය ඉල්ලුම සපුරා ඇත.

බ්‍රසීලය- දකුණු ඇමරිකාවේ විශාලතම රට වන බ්‍රසීලය එහි පුළුල් භූමි ප්‍රදේශයෙන් සහ විවිධ භූගෝලීය පිහිටුම් මඟින් ප්‍රතිලාභ ලබයි. එය කෘෂිකාර්මික ඉඩම්, ඛනිජ සහ බලශක්ති සංචිත ඇතුළු ස්වභාවික සම්පත් බහුලය. බ්‍රසීලය සෝයා බෝංචි, කෝපි, හරක් මස්, යපස් සහ තෙල් වැනි භාණ්ඩවල ප්‍රමුඛ අපනයනකරුවෙකි. එහි භූමි ප්‍රදේශයේ සැලකිය යුතු කොටසක් ආවරණය වන ඇමසන් වැසි වනාන්තරය පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා අවස්ථා සපයයි.

දකුණු කොරියාව- සීමිත ස්වභාවික සම්පත් තිබියදීත්, දකුණු කොරියාව එහි භූගෝලීය පිහිටීම අනුව චීනය සහ ජපානය වැනි ප්‍රධාන ආර්ථිකයන්ට සමීප වීමෙන් ඊට සමීප උපාය මාර්ගික කර්මාන්ත සංවර්ධනය කිරීම මඟින් ප්‍රතිලාභ ලබයි. විශේෂයෙන් ඉලෙක්ට්‍රොනික උපකරණ, මෝටර් රථ, නැව් තැනීම සහ අර්ධ සන්නායක වැනි ක්ෂේත්‍රවල අධි තාක්ෂණික නිෂ්පාදනයේ ගෝලීය ප්‍රමුඛයා ලෙස දකුණු කොරියාව තහවුරු වී ඇත. එහි උපායමාර්ගික පිහිටීම වෙළඳාම පහසු කර ඇති අතර නිෂ්පාදන භාණ්ඩවල ප්‍රධාන අපනයනකරුවෙකු වීමට දකුණු කොරියාවට හැකි වී තිබේ.

ඕස්ට්‍රේලියාව- ද්වීපත් මහාද්වීපයක් ලෙස භූගෝලීය පිහිටීම එහි ආර්ථික අවස්ථා හැඩගස්වා ඇත. රට ගල් අඟුරු, යපස්, රත්රන් සහ යුරේනියම් ඇතුළු ස්වභාවික සම්පත්වලින් පොහොසත්ය. එය ලෝකයේ විශාලතම භාණ්ඩ අපනයනයකරුවෙකි. ඕස්ට්‍රේලියාවේ වෙරළබඩ ප්‍රදේශ ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ සංචාරක ව්‍යාපාරය වැනි දියුණු වෙමින් පවතින කර්මාන්ත සඳහා සහාය වේ. එපමණක් නොව, එහි විශාල ගොඩබිම සහ හිතකර දේශගුණය විසින් තිරිඟු, හරක් මස්, ලොම් සහ වයින් අපනයනය කිරීමත් සමඟ කෘෂිකාර්මික ඵලදායිතාව සක්‍රියකර ඇත. ලොව පුරා සංචාරකයින් ආකර්ෂණය කර ගනිමින් එහි ස්වභාවික සුන්දරත්වය සහ ජෛව විවිධත්වය ද ප්‍රාග්ධනය කර ඇත.

ඉතියෝපියාව- අප්‍රිකානු කලාපයේ පිහිටා ඇති ඉතියෝපියාව මෑත වසරවලදී සැලකිය යුතු ආර්ථික ප්‍රගතියක් ලබා ඇත. රතු මුහුදට සහ සූවස් ඇළට සමීපත්වය මඟින් නැගෙනහිර අප්‍රිකාවේ කලාපීය වෙළඳපොළවල් වෙත ප්‍රවේශය පහසුකරයි. ඉතියෝපියාව ප්‍රවාහන ජාල සහ කාර්මික කලාප ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සහ වෙළඳාමට පහසුකම් සැලසීම කෙරෙහි අවධානය යොමු කර ඇත. විශේෂයෙන් කෝපි නිෂ්පාදනයෙන් ලොව ප්‍රමුඛ අපනයනකරුවෙකු බවට පත්ව ඇත. ඉතියෝපියාවේ රජය නිෂ්පාදන සහ රෙදිපිළි කර්මාන්ත දිරිගැන්වීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා ඇති අතර, එහි අඩු ශ්‍රම පිරිවැය සහ ජාත්‍යන්තර වෙළඳපොළ සමඟ වෙළඳාම සඳහා උපායමාර්ගික පිහිටීම උත්තේජනය කරයි.

මේ භූගෝලීය පිහිටුම අනුව රටක් සංවර්ධන උපාය මාර්ග සකස් කරගැනීම ගැන උදාහරණ කිහිපයක් පමණි. එහෙත් මෙම තත්වයන් අත්පත් කරගැනීම වෙනුවෙන් එම රටවල් පටු අවස්ථාවාදී දේශපාලනයේ ගොදුරු බවට පත් නොවී සිය අනාගතය වෙනුවෙන් ගත් ප්‍රතිපත්තිමය තීරණ මත ප්‍රායෝගික ක්‍රියාමාර්ග රැසක් ගෙන තිබේ.

## ලංකාව ගත යුතු මඟ

මේ අනුව ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවේ භූ පිහිටීම අනුව අත්පත් කරගත හැකි ප්‍රතිලාභයන් සලකා බැලුවහොත් ලෝකයේ අනෙක් රටවල තරමට හෝ ඊටත් වැඩි අවස්ථා මෙරටට තිබෙන බව පැහැදිලිය.

උපාය මාර්ගික පිහිටීම- ඉන්දියානු සාගරයේ ප්‍රධාන නැව් මාර්ග ඔස්සේ ශ්‍රී ලංකාවේ පිහිටීම සමුද්‍ර වෙළඳාම සහ සැපයුම් සඳහා ශක්තිමත් මධ්‍යස්ථානයකි. ප්‍රතිනැව්ගත කිරීමට පහසුකම් සැලසීම සහ ජාත්‍යන්තර නැව් සමාගම් ආකර්ෂණය කරගැනීමේ අවස්ථාවලින් දැනටමත් යම් ප්‍රයෝජනයක් ගෙන ඇත. තවදුරටත් කාර්යක්ෂම වරාය යටිතල පහසුකම් සහ සැපයුම් හැකියාවන් වර්ධනය කිරීම මඟින් ගෝලීය වෙළෙඳපොළ සමඟ සම්බන්ධතාව වැඩිදියුණු කළ හැකිය. එසේම දකුණු ආසියාවේ පිවිසුම් දෙරටුව ලෙස ශ්‍රී ලංකාව වරාය සහ ගුවන් කේන්ද්‍රස්ථානයක් ලෙසත් යම් ලෙසකින් සේතු සමුද්‍රම් හරහා ඉන්දියාවට ගොඩබිම් මාර්ගයක් විවෘත කරගත හැකි නම් ශ්‍රී ලංකාව සමස්ත ආසියාව හා ගොඩ බිමෙන්ද සම්බන්ධ වෙනු ඇත. මේ අතර චීනයේ සේද මාවත වැඩපිළිවෙල (BRI), තුළ ශ්‍රී ලංකාව යනු වැදගත්ම සංධිස්ථානයක්වීම තුළ මෙරටට ආර්ථික අවස්ථා බොහොමයක් විවෘත වෙනු ද ඇත.

සංචාරක හා ආගන්තුක සත්කාරය- ශ්‍රී ලංකාවේ නිවර්තන දේශගුණය, දර්ශනීය භූ දර්ශන සහ පොහොසත් සංස්කෘතික උරුමයන් එය ආකර්ශනීය සංචාරක ගමනාන්තයක් බවට පත් කර ඇත. සුන්දර වෙරළ තීරයන්, මධ්‍යම කඳුකරය පාරිසරික සංචාරක ව්‍යාපාරය සඳහා අවස්ථා සපයයි. ඉන්දියාවේ සහ අග්නිදිග ආසියාවේ ප්‍රධාන සංචාරක වෙළඳපොළවල්වලට භූගෝලීය වශයෙන් සමීපව සිටීම මත ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට තවදුරටත් ප්‍රතිලාභ ලබා දෙන අතර ආර්ථික වර්ධනයට සහ රැකියා උත්පාදනයට දායක වේ.

කලාපීය සම්බන්ධතාවය - ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ඉහළ කලාපීය සහයෝගීතාවයක් සඳහා අවස්ථා සපයා ඇත. ඉන්දියානු සාගර රිම් සංගමය (IORA), බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා බෙංගාල බොක්ක මුලපිරීම (BIMSTEC), වැනි බහුපාර්ශවිය ආර්ථික ඒකාබද්ධතාවයන් සහ කලාපීය රටවල ද්විපාර්ශ්වික ගිවිසුම් ආදිය මෙරට ආර්ථිකය ප්‍රවර්ධනය සඳහා දොරටු ගණනාවක් විවෘත කරයි.

ස්වභාව සම්පත් - සාරවත් භූමිය සහ විවිධ පරිසර පද්ධති වැනි ශ්‍රී ලංකාවේ භූගෝලීය විශේෂතා මෙන්ම තිරසාර සංවර්ධනය ඉලක්කකරන කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සඳහා නව ව්‍යාපාරික අවස්ථා පවතී.

එහෙත් මෙරට භූගෝලීය පිහිටීම තිරසාර සංවර්ධනය අභියෝග ද මතු කරයි. ශ්‍රී ලංකාව සුළි කුණාටු බහුල කලාපයක පිහිටීම හේතුවෙන් සුළි කුණාටු, ගංවතුර සහ නියඟ ඇතුළු ස්වභාවික විපත්වලට ගොදුරු වේ. ආපදා සඳහා සූදානම් වීම, යටිතල පහසුකම් සැලසුම් කිරීම සහ දේශගුණයට අනුවර්තනය වීමේ පියවරයන් හරහා මෙම සිදුවීම්වලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම විය යුතුය.

එමෙන්ම ශ්‍රී ලංකාවේ පිහිටීම ඉන්දියාවේ සහ අග්නිදිග ආසියාවේ විශාල වෙළඳපොලවල්වලට සමීප තිබීම වාසියක් වුවත්, අනෙක් කලාපීය රටවල තරඟකාරීත්වයට ද මුහුණ දීමට සිදුවේ. මේ නිසා ශ්‍රී ලාංකේය නිෂ්පාදන සහ සේවා සඳහා වෙළඳපොළ ප්‍රවේශය උපරිම කිරීම සඳහා වෙළඳ පහසුකම් වැඩිදියුණු කිරීම, වෙළඳ බාධක අඩු කිරීම සහ ප්‍රවාහන සහ සැපයුම් ජාල හරහා සම්බන්ධතා වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව තිබේ. ද්වීපත් රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම, ඇතැම් භාණ්ඩ සහ සම්පත් සඳහා ආනයන මත යැපීම වැඩි කර ඇත. මෙය වෙළඳ ශේෂය, විදේශ විනිමය සංචිත සහ ගෝලීය මිල උච්චාවචනය සම්බන්ධ අවදානම ඉහළය. එම අභියෝගවලට මුහුණ දීමට ක්‍රමවේද තිබිය යුතුය.

## මාර්ගය විවෘත කර ඇත

කොහොම නමුත් නව තාක්ෂණය සහ පවතින ගෝලීය පිළිවෙල මෙරටට නව අවස්ථා ඕනෑ තරම් සපයා ඇති අතර, එහි වාසිය ගැනීම, අභියෝග ජය ගැනීම වෙනුවෙන් උපාය මාර්ගික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තිරසාර ආර්ථික වර්ධනයක් සහ සෞභාග්‍යයක් සඳහා රටේ විවෘත කළ හැකිය. ජනාධිපති රනිල් ක්‍රියාත්මක කරන නව ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල හරහා මේ වන විට ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග ජයගැනීම සහ ආර්ථික සංවර්ධනය කිරීම සඳහා විවිධ මුල පිරීම් සහ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කර ඇත.

ඒ අතර ශ්‍රී ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම සඳහා කොළඹ වරාය පුළුල් කිරීම සහ හම්බන්තොට වරාය සංවර්ධනය කිරීම ද අනෙක් වරාය යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ද පියවර ගෙන ඇත. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය හරහා නවීන මූල්‍ය මධ්‍යස්ථානයක් සහ කලාපීය ව්‍යාපාරික මධ්‍යස්ථානයක් නිර්මාණය වෙනු ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ වැනි ගුවන් තොටුපළවල් පුළුල් කිරීම සහ නවීකරණය කිරීම මඟින් ගුවන් සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ සංචාරකයින් සහ ව්‍යාපාරික සංචාරකයින් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම අරමුණු කර ඇත. විදේශ ආයෝජන, මෙරට කර්මාන්ත ව්‍යපාර වර්ධනය වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනයට ප්‍රමුඛත්වය දී ඇත. දේශීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන වියදම් අඩු කිරීම සඳහා මාර්ග ජාල, මහාමාර්ග සහ අධිවේගී මාර්ග ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම වැනි ව්‍යාපෘති කෙරෙහි රජය යොමුව තිබේ.

කලාපීය ආර්ථික සහයෝගීතාවය ශක්තිමත් කිරීම සඳහා ජනාධිපතිවරයා සුවිශේෂී මෙහෙවරක් යෙදී සිටී. කලාපීය ආර්ථික බලවතා වන ඉන්දියාව සමඟ මෙන්ම චීනය සමඟද සම්බන්ධතා දියුණු කර ඇත. කලාපීය ආර්ථික ඒකාබද්ධතාවය මඟින් කලාපීය සංවර්ධනය වෙනුවෙන් ජනාධිපතිවරයා දැඩිව පෙනී සිටින අතර ගෝලීය පිළිවෙතට විකල්පව නව ආසියානු පිළිවෙතක් ගොඩනැගීමද ඔහුගේ අපේක්ෂා අතර වේ.

තේ, කුරුඳු වැනි අපනයන බෝග සහ ඇඟලුම් වැනි සාම්ප්‍රදායික අංශවලින් ඔබ්බට අපනයන පදනම විවිධාංගීකරණය කිරීමට අවශ්‍ය පියවරයන්ට මේ වන විට බර තබා ඇත. අගය එකතු කළ කර්මාන්ත සහ සාම්ප්‍රදායික නොවන අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විවිධ ප්‍රතිපත්ති සහ මුලපිරීම් හඳුන්වා දී ඇත.

බලශක්ති අභියෝගවලට මුහුණ දීම සහ ආනයනික පොසිල ඉන්ධන මත යැපීම අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු කරයි. සූර්ය, සුළං සහ ජල විදුලිබල උත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත.

ස්වභාවික විපත්වලට ශ්‍රී ලංකාව ගොදුරුවීමේ අවදානම සැලකිල්ලට ගෙන, රට ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණයට අනුවර්තනය වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව කටයුතු කරමින් සිටී. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සඳහා ආයෝජනය කිරීම, ආපදා ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ යටිතල පහසුකම් ඔරොත්තු දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙයට ඇතුළත් වේ. දේශගුණික විපර්යාස අවම කිරීම් වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන ඇත.

වර්ධනය වන ආර්ථිකයක අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකාව මානව ප්‍රාග්ධන සංවර්ධනය කෙරෙහි අවධානය දැඩිව යොමු කර ඇත. ශ්‍රම බලකාය අතර කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා රජය නව අධ්‍යාපන ක්‍රමවේදයක් මෙන්ම හා වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා විශාල ආයෝජනයක් කිරීමට තීරණය කර ඇත. එමෙන්ව විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විශාල ප්‍රමාණයක් නුදුරේම පිහිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේ.

## ස්ථාවර රටකට ඇති බාධාව

මේ ආදී වශයෙන් අනාගත අභියෝගවලට මුහුණ දීම සහ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ජනාධිපතිවරයා ඇතුළු රජයේ කැපවීම පෙන්වා ඇත. කෙසේ වෙතත්, මෙම ප්‍රයත්නවල සාර්ථකත්වය රඳා පවතින්නේ ඵලදායි ලෙස මේ පියවරයන් ක්‍රියාත්මක කිරීම, අඛණ්ඩ ආයෝජනය සහ දේශපාලන ස්ථාවරත්වයක් සහිත ශක්තිමත් පාලනයක් මත බව අවධාරණය කළ යුතුය.

ශ්‍රී ලංකාව මුහුණදෙන අභියෝගය ඇත්තේ මෙතැනය. කුඩා ආර්ථිකයක් සහිත රටකට තමන්ට කෙතරම් අවස්ථා තිබුණත් නැගිටීමට තනිවම නොහැකි බව අමුතුවෙන් කිවයුතු නැත. විශේෂයෙන්ම බංකොලොත් බවට පත්ව තිබෙන මොහොතක බාහිර ආධාර උපකාරයන් නොමැතිව ඒ සඳහා ඇති අවස්ථා ඉතාම විරලය. භූමියක් තිබුණාට, ජනතාවක් සිටියද, කොහොම හෝ වේලක් නොකා වේලක් කා හෝ සිටීමට හැකිවීම පමණක් ප්‍රමාණවත් නම් මේ තිබෙන විදිහත් හොඳ වැඩිය. නමුත් අපේක්ෂා කරන රට එය නොවේ. 75 වසරක අසමත්කම ගැන මැසිවිලි නගන්නේ එවැනි රටක් වෙනුවෙන් නොවේ. රටක් විදිහට අභිමානයෙන් දෙපයින් නැගි සිටිය යුතුය. ලෝකය ජය ගත යුතුය. නමුත් ඒ වෙනුවෙන් අනෙක් බාහිර පාර්ශ්වයකින් සහය ලබාගැනීමට සිදුව තිබේ නම් ඒ අත් නොහැරිය යුතුය. විදේශ ආයෝජකයන් අවශ්‍යය. ජාතන්තර සංවිධානවල සහය අවශ්‍යය. නමුත් ඒ සහය ලබාගැනීම හිඟා කෑමක් නොවී ගනුදෙනුවක් විය යුතුය. දෙයක් ගන්න නම් සමාන දෙයක් දිය යුතුය. දෙපාර්ශ්වයටම එහි වාසි තිබිය යුතුය. විදේශ ආයෝජන යනු රටට නැති දෙයක් අත්පත් කරගැනීමය. ඒ වෙනුවෙන් එම පාර්ශ්වයට අවශ්‍ය රටේ තිබෙන දෙයක් ලබා දීම සාධාරණ හුවමාරුවකි. නමුත් ඒ දෙන දෙයට එරෙහිව කටයුතු කිරීමෙන් අවසානයේදි රටට කිසිවක් අත්පත් කරගැනීමට හැකිවන්නේ නැත.

මේ රටේ සිදුවුන තරමක් වුයේ විදේශ ආයෝජකයන් මෙරට ආයෝජනයට කැමති වුවත් ඊට කැමැත්තක් ලබාදීමට රට සමත් නොවීම මත ලබාගත යුතු දේ අහිමි කරගැනීමය. ත්‍රිකුණාමලයේ නිකම් දිර දිරා යන තෙල් ටැංකි සමූහය විදේශ අයෝජකයන් ලවා සංවර්ධනය කර ඉන් ප්‍රතිලාභයක් ලැබීමේ අවස්ථාවන් පටු ආකල්ප නිසා පරාජය විය. ටැංකි රැකගත්තා කියා රටට ලැබුණ දෙයක් නැත. කොළඹ වරාය නැගෙනහිර ජැටිය, බටහිර ජැටිය ආයෝජනයට ආ විරෝධයත් එසේමය. ඊට පෙර දකුණු ජැටිය සම්බන්ධයෙන්ද එලෙසම විරෝධයන් පැමිණි නමුත් එය නොතකා කටයුතු කිරීම නිසා අද කොළඹ වරාය ලෝකයේ කාර්ය බහුලම සහ මෙම කලාපයේ අංක එකේ වරාය බවට පත්ව තිබේ. විදුලි සංදේශ දෙපාර්තමේන්තුව පෞද්ගලීකරණය නොකරන්න ශ්‍රී ලංකා ටෙලිකොම් නැමැති විශිෂ්ට සේවය රටට නොලැබෙන්නට ඉඩ තිබිණි. සිංගප්පූරුව දියුණු වූයේ මෙරට පිහිටීම මතම ගොඩනගා ගැනීමට හැකිව තිබූ කලාපයේ ප්‍රධානතම ඛනිජ තෙල් බෙදාහැරීමේ මධ්‍යස්ථානය විනාශ කිරීමෙන් පසුව ඔවුන් අත්පත් කරගැනීමෙනි. මේ ආදී උදාහරණ තවත් පෙන්වා දිය හැකිය. පැවැති අවස්ථාවන් නැති කරගැනීමෙන් ලංකාව ලෝක වාර්තාවක් තබන්න පුළුවන් තරම් දේ කර ඇත.

මේ නිසා රටේ උපාය මාර්ගික පිහිටීමත් මෙරට මානව ප්‍රාග්ධනය ගොඩනගා ගැනීමත් මගින් රට සංවර්ධනයේ මාර්ග යට ඇද දැමීමට වත්මන් රජය ගන්නා උත්සාහයටවත් අකුල් නොහෙලා සිටියොත් රටේ සංවර්ධන සිහිනය සැබෑ කරගැනීමට අවශ්‍ය මාර්ගය නිතැතින්ම ගොඩ නැගෙනු ඇති බව සැකයකින් තොර බව පැවසිය හැකිය. මෙරට විනාශ කළේම මේ සංවර්ධන අවස්ථාවලට අකුල් හෙළු පටු අවස්ථාවාදී ජාතිකවාදින්ගේ වාමාංශිකයන්ගේ මෝඩ විරෝධයයි. එය යළිත් වීමට ඉඩනොදීම රට ජනතාවගේ වගකීමක් එමෙන්ම අනාගත පරපුර වෙනුවෙන් කළ යුතු යුගයේ යුතුකමය.



ජයතුංග බණ්ඩාර

# IMF දෙවැනි වාරිකය ලැබීමෙන් පසුව මොකද වෙන්නේ?

## මුදල් රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ



ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් ගිවිසුම සහ විස්තීරණ ණය පහසුකම යටතේ දෙවැනි වාරිකය ලබාගැනීම වෙනුවෙන් අත්‍යවශ්‍යව තිබූ කාර්ය මණ්ඩල එකඟතාවයට එළඹුණා.

මොරොක්කෝවේ පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ වාර්ෂික හමුවේදී අපි මේ පිළිබඳව තවදුරටත් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. ඒ වන විටත් විවිධ කරුණු සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීමට සිදු වූ නිසා අප නැවත ලංකාවට පැමිණ ඔවුන් සමග මාර්ගගත ක්‍රමය ඔස්සේ සාකච්ඡා කළා.

2023 මාර්තු මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ගිවිසුම් ගතවීමට අනුමැතිය ලැබුණු දා සිට එහි අපට තිබූ හිතකර තත්වය පිළිබදව නොතකා පසුගිය සති කිහිපය වන විටත් ඇතැම් පාර්ශ්ව වෙතින් යම් යම් බාධා කිරීම් සිදුවුණා. ඇතැම් කණ්ඩායම්වලට මෙම සාකච්ඡා පිළිබඳව නිසි අවබෝධයක් තිබුණේ නැහැ. ඔවුන් විවිධ තර්ක ඉදිරිපත් කළා. එහිදී ඔවුන් කටයුතු කළේ දෙවැනි වාරික මුදල අපට ලැබෙයිද යන්න සම්බන්ධව සාමාන්‍ය ජනතාවටත් අනෙක් පාර්ශ්වයන්ටත් සැකයක් ඇතිවෙන ආකාරයටයි.

නමුත් දෙවැනි වාරිකය ලබාගැනීමට හෝ ඒ සඳහා විධායක කමිටුවේ අනුමැතිය ගැනීමට අප කිසිම බියක් ඇති කර ගතයුතු නැති බව අප පාර්ලිමේන්තුවේදී මෙන්ම ඉන් පිටතදීත් දැඩිව අවධාරණය කළා. රජයක් ලෙස අපට ඒ විශ්වාසය තිබුණා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වන වැඩසටහනට අදාළ පළමු සමාලෝචනය කිරීම පිළිබඳ කාර්යමණ්ඩල එකඟතාව මගින් බහුපාර්ශ්වික ණය හිමියන්ට හිඟ වාරික ගෙවීමට සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම වේගවත් කිරීමට උපකාරී වන බව කිව යුතුයි.

ඒ වගේම කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුම (SLA) හරහා ලෝක බැංකුවට, ආසියානු සංවර්ධන බැංකුවට සහ අනෙකුත් බහුපාර්ශ්වික මූල්‍ය ආයතනවල වෙත ඉතිරි වාරික ගෙවීමට හැකියාව ලැබෙනවා. එමගින් ජාත්‍යන්තර හවුල්කරුවන් සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු වේගවත් කිරීමට උපකාරී වනවා.

ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධ එකඟතාවන් ද නුදුරේදීම අවසන් කළ හැකියි. රජයේ ප්‍රධානතම අරමුණ වුනේ දූෂණය අවම කිරීම සහ විනිවිද භාවය වැඩි කිරීමයි. ලංකාවේ ආර්ථිකය අද තිබෙන තත්ත්වයට ගෙන ඒම පිළිබදව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රශංසා කළා. එමගින් ශ්‍රී ලංකාව පිළිබඳව ජාත්‍යන්තරයට තිබෙන විශ්වාසය තවදුරටත් තහවුරු කෙරුණා.

ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා අපට මෙය බෙහෙවින් අවශ්‍ය වුණා. මේ කාර්ය මණ්ඩල එකඟතාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය අනුමත කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 330 ක දෙවන වාරිකය ලැබීමට නියමිතයි.



# සමාජමාධ්‍ය නියාමන පනතක් සංවර්ධනය වෙමින් පවතින රටකට අවශ්‍යද?

## පාර්ලිමේන්තු මන්ත්‍රී වජිර අබේවර්ධන

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා අපි මේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මෙය සම්මත කළ යුතුයි. මේක ජාතික අවශ්‍යතාවයක්. ඒ වගේම අන්තර්ජාලය හරහා වෛරී ප්‍රකාශයන් නිසා පසුගිය කාලවල ජාතීන් අතර කෝලාහල ඇති කෙරුණා. ඒ වගේම අන්තර්ජාලය හරහා සිදුවන හිරිහැර හේතුවෙන් තරුණයින් සියදිවි නසාගන්නා ආකාරය වාර්තා වුණා. විශේෂයෙන් තරුණ පරම්පරාව අද Facebook, Twitter, Tiktok, Instagram සහ Youtube වැනි සමාජ මාධ්‍යය හරහා ලබා දෙන ඇතැම් පණිවුඩ පිළිබඳ සැලකූ විට ඔවුන් ඉතාමත් අසහනකාරී මානසිකත්වයකින් සිටින බව පෙනී යනවා.

ප්‍රේම සම්බන්ධතා බිඳ වැටීම් වැනි සිදුවීම් සමග සියදිවි හානිකර ගැනීම දක්වා එම අවාසනාවන්ත තත්වය වර්ධනය වී තිබෙනවා. මේ සඳහා වන සමාජ මාධ්‍යවල බලපෑම අවම කරගැනීම වෙනුවෙන් නීති රීති අවශ්‍ය බව යෞවන යෞවනියන් ද අද පිළිගන්නා කරුණක්.

Facebook ඇතුලු අනෙකුත් තොරතුරු මාර්ග ජනතාවට හානිදායක ලෙස බලපෑම පාලනය කරමින්, ජනතාවට වඩාත් යහපත් ලෙස නිවැරදි තොරතුරු සැපයීමටත්, එමෙන්ම ව්‍යාජ තොරතුරු සපයන පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටත් ලෝකයේ රටවල් කටයුතු කර තිබෙනවා. මෙය දියුණු වන සමාජයකට ඉතා වැදගත්ම අංශයක් බව අප මතක තබා ගත යුතුය.

සිංගප්පූරුව, චීනය වගේ ස්වදේශිකයින්ට සිදුවන වෛරය නැවැත්විය යුතුයි. අසත්‍ය තොරතුරු නැවැත්විය යුතුයි. මේ වගේ සමාජයක් අවසන් කළ යුතුයි. මෙය සත්‍ය හෙළි කිරීමට ප්‍රබල පිටුබලයක් වනවා. මේ පනත සම්මත වූ පසු සත්‍යය ජය ගනීවි.

සිංගප්පූරුව, චීනය, මැලේසියාව, දකුණු කොරියාව වැනි රටවල් අනුගමනය කළ නීති මෙහි ද හඳුන්වා දිය යුතු බව ප්‍රකාශ කිරීමට කැමැතියි. අපි අපහාස සහ වැරදි තොරතුරු පාලනය කළ යුතුයි. සංවර්ධිත ජාතියක් වීමට අවශ්‍ය රටක් ලෙස ශ්‍රී ලංකාව ද සියලු දෙනාගේම එකඟතාවයෙන් පනත් කෙටුම්පත සකස් කළ යුතුයි.

සමහර නීති විශාරදයින් අදහස් කර ඇත්තේ පනත් කෙටුම්පත වත්මන් ආකෘතියේ මෙන්, එය නීතියක් බවට පත් කිරීම සඳහා තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරයක් හෝ ජනමත විචාරණයක් අවශ්‍ය විය හැකි බවයි.

නීතිමය ක්‍රියාමාර්ග සඳහා කොමිසම කඩකරන්නන් මහේස්ත්‍රාත් අධිකරණයට හෝ ඊට ඉහළින් ඇති අධිකරණයකට යොමු කරනවා.

සමාජ ජලා නියාමනයක අවශ්‍යතාවය පිළිබඳ කතිකාවක් ශ්‍රී ලංකාව තුළත් පවතිනවා. 1978න් පසුව ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍යය වෙනස් වෙමින් ඉදිරියට පැමිණ තිබෙනවා. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහෝදර ශාන් වික්‍රමසිංහ මැතිතුමා විසින් ITN ආයතනය ආරම්භ කළා. පසුව එය රජයට පවරා ගත්තා. ඉන්පසුව 1978න් පසු ශ්‍රී ලංකාවේ තිබු එකම ගුවන් විදුලිය වෙනුවට ගුවන් විදුලි නාලිකා රාශියක්, ඒ වගේම රූපවාහිනි නාලිකා විශාල ප්‍රමාණයක් ආරම්භ කිරීමට රජය විසින් අවස්ථාව ලබා දුන්නා. සියලු රූපවාහිනී මාධ්‍ය පාලනය වුණේ රූපවාහිනි පනතෙන් පමණයි. එය කිසිසේත්ම සාධාරණ හෝ මාධ්‍ය දියුණුවට සුදුසු තත්ත්වයක් නොවේ.

එසේ නම් ලෝකයේ දියුණු වූ රටවල් තොරතුරු සන්නිවේදනය, එසේ නොමැති නම් මාධ්‍යය නිවැරදි කිරීම සඳහාත් ජනතාවට නිවැරදි තොරතුරු සැපයීම සඳහාත්, නීති රීති පද්ධතිය සකස් කරගෙන තිබෙනවා. උදාහරණයක් ලෙස සිංගප්පූරුවේ තොරතුරු සන්නිවේදන මාධ්‍යය අධිකාරී පනත එහි දියුණුවට ඉතාමත් වැදගත් වී තිබෙනවා.

# ගාසා ගැටුම සහ ඉන්ධන අර්බුදය අපට බලපාන්නේ කොහොම ද?

## විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක



වත්මන් මැදපෙරදිග ගැටුම් ශ්‍රී ලංකාවේ ඉන්ධන ආනයන කටයුතුවලට බලපාන්නේ නැහැ. මිල සූත්‍රය වෙනස් කළද 2024 ජුනි මාසය දක්වා මෙරට ඉන්ධන හිඟයක් ඇති නොවන බව විශ්වාසයි.

ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන මිලදී ගැනීම සඳහා ඩොලර් මිලියන 200ක සංචිතයක් අප පවත්වාගෙන යනවා. සිනොපෙක් සමාගම ඉන්ධන සැපයීමේ කටයුතු ආරම්භ කර ඇති නිසා තවත් ඩොලර් මිලියන 40ක් ඉතිරි කර ගැනීමට හැකි වුණා.

සිනොපෙක් සමාගම ඉන්ධන ආනයනය කිරීම නිසා මෙම මුදල ඉතිරි වී තිබෙනවා. අනෙක් සමාගම් දෙක ඔවුන්ගේ ඉන්ධන බෙදා හැරීමේ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු වසරකට ඩොලර් මිලියන 400-500ක් ඉතිරි කර ගත හැකි බව අපි විශ්වාස කරනවා.


මේ මස මුල් සතියේදී ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල සියයට 3-4කින් අඩු වුවද එතැන් සිට ඊශ්‍රායලය සහ හමාස් සංවිධානය අතර ඇති වූ ගැටුම් හේතුවෙන් මිල සියයට 4කින් ඉහළ ගොස් තිබෙනවා. ඊශ්‍රායලය සහ පලස්තීනය තෙල් නිෂ්පාදනය කරන රටවල් නොවේ. කොහොම වුණත් ඉරානය, අමෙරිකාව වැනි රටවල නිවේදන නිරීක්ෂණය කිරීමේදී ඉන්ධන සම්බන්ධයෙන් අවිනිශ්චිත බවක් තිබෙනවා.

එක් අතකින් ඉස්ලාමීය රටවල් ඊශ්‍රායලයට ඉන්ධන සැපයීම සම්පූර්ණයෙන්ම නවතා දමා තිබෙනවා. අනෙක් අතට, එක්සත් ජනපදය වෙනිසියුලාවට සැපයීම අඩු කර තිබෙනවා. මේ නිසා ඉන්ධන වෙළෙඳපොළ තත්ත්වය විශ්ලේෂණය කිරීමට අපහසුයි.

කොහොම වුණත් මේ වන විට ලෝකයේ හොඳම ඉන්ධන බෙදාහරින්නන් 10 ශ්‍රී ලංකාවට ඉන්ධන සපයනවා. ඒ ඉන්ධන සැපයීම නතරවීමක් වෙන්නේ නැහැ.

සටහන
අසන්ත බණ්ඩාර

# රාජ්‍යය ගොඩනැගීමේ පුද්ගල අයිතීය සහ වගකීම



මිහිතලයේ ජීවත්වන සතුන් අතර මනස දියුණුම සත්වයා ලෙස සැලකෙන මිනිසා සිය හුදකලා ජීවිතයෙන් මිදී සාමූහික ජීවිතයක් ආරම්භ කරන්නේ ඉතිහාසයේ යම් තැනකදී ද, මිනිසාගේ සමාජ ජීවිතයේ ආරම්භය එතැනය. ඒ අනුව සාමූහික ජීවිතයේ පැවැත්ම සඳහා පොදු එකඟතාවයන් ඇති වන්නේය. මිනිසාට ශිලාචාර සමාජ ජීවිතයක් ගෙනයාම පිළිබඳ ඓතිහාසික තත්වයන්, ආරම්භයේදී සරල කොන්දේසි යටතේ ඇතිවුවත්, ඒවා සංකීර්ණ හා පුළුල් කොන්දේසි බවට පත්වන්නේ කරුණු දෙකක් මතය. ඒ මිනිස් ජනගහනයේ වර්ධනයත් සමඟ සමාජය පුළුල්වීමත්, මිනිසා අත්දකින දේ හා ඒ මත ගොඩනැගුණු මිනිසාගේ දැනුම දියුණුවීමත් නිසාය.

දැනුම මිනිසා ජානගතව ගෙන ආ දෙයක් නොවන අතර මිනිස් බුද්ධිය තුළ දැනුම වර්ධනය වන්නේ මිනිසාට තම අවශ්‍යතා සපුරාගැනීමට පවත්නා සම්පත් භාවිතය පිළිබඳ සැලසුම් කිරීමට දරණ උත්සහය නිසාය. දැනුම වර්ධනයත් පුද්ගලයින්ට අවේනික ආශාව නැතිනම් තෘෂ්ණාව සමග කටයුතු කිරීමට යාමේදී ඇතිවන අනවරත ගැටුම් පාලනය කරගනිමින් සමූහිකව සම්පත් තොගය බෙදාගෙන නිෂ්පාදනය කිරීම, පරිභෝජනය හා අතිරික්තය බෙදාහැරීම පිළිබඳව සඳහා පාලනයක් අවශ්‍යවිය. එය සංවිධානය කරගැනීමට යම් විධිමත් ව්‍යුහයක් අවශ්‍ය වූ අතර පසුව රාජ්‍යය යන සංකල්පය බිහිවීමද ඒ අනුව විය.

## රාජ්‍යය බිහිවීම හා මිනිස් ස්වභාවය

රාජ්‍යය පිළිබඳ සංකල්පය තුළ මිනිසාගේ හැසිරීම පිළිබඳව කථා කරයි. එහිදී ඔහුගේ ආරක්ෂාව පිළිබඳව විමසයි. තනි පුද්ගලයෙකුගේ හැසිරීම නිසා සමාජයකට ඇතිවන බලපෑම පිළිබඳව සලකා බලයි. ඒ අනුව රාජ්‍යය යනු සමාජයේ පුද්ගල හැසිරීම පිළිබඳව සලකා බලන **සාමාජ ප්‍රපංචයක්** ලෙස දැක්විය හැකිය. එමෙන්ම රාජ්‍යය, සමාජයක් පාලනයට අදාල කොන්දේසි පනවමින් කටයුතු කරන **දේශපාලන ප්‍රපංචයකි**. තවද සමාජයේ මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට දරන උත්සහයේදී සම්පත් භාවිතය පාලනය කරන ගැන කතා කරන **ආර්ථික ප්‍රපංචයකි.**

මිනිසා ජීවත්වන්නේ, ප්‍රධාන කරුණු තුනක් ඉටු කර ගැනීමේ උවමනාවන් හා ගැටෙමින්ය. ඒ බලයට ඇති කැමැත්ත, ධනයට ඇති කැමැත්ත හා ලිංගිකත්වයට ඇති කැමැත්ත ඉටුකර ගැනීමටය. එය දියුණුවන මනසක් සහිත සත්වයෙක් ලෙස මිනිසා නිරන්තරව කරන අරගලයයි. මේ අරගලයේ යෙදෙන මිනිසා පාලනයට අදාලව රාජ්‍යය කටයුතු කළයුත්තේ එම අරමුණු ඉටුකර ගැනීමට හැකි නිදහස ද මිනිසා වෙනුවෙන් ඇති කරවන ආකාරයෙන්ය.

**මිනිසා බලයට ඇති කැමැත්ත** යන්නෙන් අදහස් වන්නේ, තමන් සමාජයේ සාමූහිකව ජීවත් වන අතර තම පෞද්ගලික හා කුටුම්භ ජීවිතය ආරක්ෂා කරගැනීමට, යම් සමාජ ආධිපත්‍යයක් තහවුරු කරගැනීමට ඇති කැමැත්ත හා වුවමනාවය. ඒ සඳහා ඔහු දේශපාලන බලයට අත පෙවීමට කැමැතිය. එමෙන්ම ඔහු තමන්ට විශ්වාසනීය පුද්ගලයින්ට බලය දිමට කැමැතිය. නැතිනම් තමන්ට බලය ලබාගැනීමට කැමැතිය. තවද බලය වෙනුවෙන් කේවල් කිරීමට කැමැතිය. මෙයින් ප්‍රකාශ වන්නේ මිනිසා බලයට ඇති කැමැත්තය.

මිනිසා සමාජ ජීවිතය ගෙන යාමේදී ඔහුට ආර්ථික පසුබිම වැදගත් නිසා ඔහු ධනය රැස් කිරීමට කැමැතිය. ඔහු ධනය රැස් කිරීමට දැනුම, කුසලතාවන් භාවිතා කරයි. එහිදී ඔහු කය හා මනස අඩු වැඩි වශයෙන් භාවිතා කරමින් කටයුතු කරයි. එනම් ධනය රැස් කිරීමට ඔහු සමාජය තුළ එකින් එකා හා ගැටෙමින් ක්‍රියාකරයි. එමේ කරන්නේ **මිනිසා ධනයට ඇති කැමැත්ත** නිසාය.

එමෙන්ම මිනිසා බලයත්, ධනයත් හසුරුවන අතර තමන්ගේ ආරක්ෂාවටත්, තමන්ගේ කාර්යයන් සඳහාත් ඇති ශ්‍රම අවශ්‍යතාවය වැඩිකර ගැනීම, තමන්ගේ පරම්පරාව පවත්වා ගැනීම මෙන්ම වර්ගයාගේ පැවැත්ම සම්බන්ධයෙන් කල්පනා කරයි. ඒ අනුව ඔහුට ලිංගික ජීවිතයක් පවත්වාගත යුතුය. එයින් **මිනිසා ලිංගිකත්වයට ඇති කැමැත්ත** ප්‍රකාශ වේ.

මෙම කරුණු තුන එකිනෙක ඒකාබද්ධව පවතින අතර මිනිසා පාලනයේදී මෙම කරුණු ඉෂ්ඨවන ආකාරය සැලකිල්ලට ගත යුතුය. ඒ අනුව මිනිසා යනු මූලිකවම දේශපාලනික සත්වයෙකි. තවත් අතකින් ආර්ථික සත්වයෙකි. එමෙන්ම සමාජ සත්වයෙකි. එනම් මිනිසාට කිසිම අවස්ථාවක මෙම කරුණුවලින් ඉවත්ව ජීවත්විමට නොහැකිය. සමාජයේ අන් අය සමඟ කටයුතු කිරීමේදී, තමන්ගේ ආර්ථිකය ගැන කතා කිරීමේදි මිනිසාට දේශපාලනයෙන් වියුක්තව කතා කිරීමට නොහැකිය.

## පාලකයෙක් තෝරා ගැනීම

මිනිසා සමාජීය ජීවිතයේදී තම සමාජයේ පාලනය සඳහා පාලකයෙක් තෝරා ගැනීමට කැමතිය. ඔහු පාලකයාට යම් කාලයකට තමන්ගේ පරමාධිපත්‍ය බලය තමන් වෙනුවෙන් මෙන්ම සමජයේ අන් අය වෙනුවෙන් එය ක්‍රියාත්මක කිරීමට පවරයි. මේ ආකාරයට සමාජයේ සියලු දෙනාම තම පරමාධිපත්‍ය පාලකයාට පැවරූ විට පාලකයා සැම දෙනා වෙනුවෙන්ම සමානත්මතාවය ඇති කිරීමට කටයුතු කරනු කිරීමට බැඳී සිටියි. මේ සඳහා පාලකයා භාවිතා කරන විධික්‍රමය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී නැතිනම් සැමට සාධාරණ විය යුතුය යන්නය.

පාලකයා විසින් මෙසේ මිනිසාගේ සමාජ ජීවිතය පාලනය කිරීම සඳහා දේශපාලන බලය ලබා ගනී. දේශපාලනයේදී සිදුවන්නේ සමස්ත සමජයක් පාලනය කිරීමට බලය යෙදීමය. එහිදි පාලකයා තම කාර්යය මෙහෙයවීම සඳහා ගොඩනඟා ගන්නා සංකල්ප ගත සංවිධානයක් පවත්වාගනී. එය මුලින් කී ආකාරයට ගොඩ නැගුණු රාජ්‍යයයි.

## රාජ්‍ය හා ආණ්ඩුක්‍රමය

රාජ්‍යය නැමැති සංකල්ප ගත සංවිධානය ස්ථිර එකකි. එය පවත්වාගෙන යන්නේ කෙසේද යන්න විස්තර කරන්නේ කොන්දේසි මාලාවකට යටත්වය. එම කොන්දේසි නම් රාජ්‍ය පාලනය විස්තර කෙරෙන ව්‍යවස්ථා මාලාවකි. එය ආදාල රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවයි. ඒ මගින් පාලකයා තෝරාගන්නේ කෙසේද?, පාලකයාගේ කාර්ය භාරය කුමක්ද?, පාලකයා ජනතාව වෙනුවෙන් ක්‍රියාකළ යුත්තේ කෙසේද?, සමාජයට රාජ්‍යයෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ඉෂ්ඨ කරන්නේ කෙසේද? සමාජයේ සමස්ත ජනතාවගේ සමානත්මතාවය තහවුරු කිරීමේදී, එක් එක් සමාජ සාමාජිකයන් වන පුද්ගලයින් වෙනුවෙන් ආරක්ෂා කළ යුතු මූලික අයිතිවාසිකම් මොනවාද? යනුවෙන් විස්තරවේ.

ඉහත දැක්වූ ලෙස රාජ්‍යය යනු සංකල්ප ගත ස්ථාවර සංවිධානයක් වන අතර එය අනම්‍ය දෙයකි. එනම් එහි හැඩය ගුණාංග පහසුවෙන් වෙනස් කළ නොහැකි විය යුතුය. එයාකාරයෙන් රාජ්‍යය පවත්වාගෙන යාමට අවශ්‍ය කුළුණු තුනක් ලෙස වෙනත් ආයතන පවතී. ඓතිහාසික දේශපාලන විචාරය තුළ එය ආයතන තුනක් ලෙස විග්‍රහ කරයි. ඒවා නම්, පාලනය පිළිබඳ තීරණ ගනු ලබන පාලකයා ඇතුලත් **විධායකයත්**, පාලකයාගේ පාලනයට අවශ්‍ය නීති සම්පාදනය කරන **ව්‍යාවස්ථාදායකය** හෙවත් පාර්ලිමේන්තුවත් එම නීති සමාජයට ඇති කළ හැකි බලපෑම විවරණය කරන අධිකරණයත්ය.

## ව්‍යවස්ථා සම්පාදනයේදී අධිකරණයේ කාර්යය

ස්ථාවර හැඩතල සහිත රාජ්‍යයේ ස්වාභාවය වෙනස් කිරීමට නම් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව වෙනස් කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම මෙහෙයවිම සඳහා පාලකයාගේත් ජනතාව පත්කර එවන අනෙක් නියෝජිතයින්ගේත් අධිකරණයේත් වගකීමයි. මේ අනුව විධායකයත්, ව්‍යවස්ථාදායකයත්, අධිකරණයත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරයේ මූලධර්මය වන්නේ සංවරණය හා තුලනයයි. එහි අදහස එක් ආයතනයක් අනෙක් ආයතනය අභිබවා නොයායුතු බවය. ඒ අනුව පාලකයා ප්‍රමුඛ විධායකයට යම් අකාරයකින් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ සංශෝධනයක් හෝ මුළුමනින්ම වෙනස් කිරීමක් සිදු කිරීමට අවශ්‍ය නම්, එය විධායකය මගින් තීරණය කර ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කළ යුතුය. ව්‍යවස්ථාදායකය යනු නීති සම්පාදන බලය ඇති ආයතනයයි. නැතිනම් ජනතාව වෙනුවෙන් නීති සම්පාදනය කිරීමට ජනතාව පත්කර ඇති ජනතා නියෝජිතයින් සිටින ස්ථානයයි. ජනාතාව විසින් මැතිවරණය හරහා පත් කීරීමෙන් ඔවුන්ට තමන් වෙනුවෙන් පොදු නීතිය සම්පදනයට බලය දී ඇත. එබැවින් ව්‍යාවස්ථාදායට නැතිනම් පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාව වෙනස් කිරීමේ කාර්යය පැවරෙන අතර එම වෙනස් කිරීම් නිසා ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට කෙරෙහි කොතරම් දුරට බලපෑම් ඇතිවන්නේද? යන්න නීරීක්ෂණය කරන්නේ අධිකරණයයි. ඒ අනුව අධිකරණයට ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට යටත්ව ජනතාවගේ මූලික අයිතිවාසිකම් අරක්ෂා කිරීමේත් තහවුරු කිරීමේත් බල ගැන්වීමේත් බලය ඇති නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් හෝ මුළුමනින්ම ඉවත් කිරීමත් සිදු කරන්නේ කෙසේද? යන්න පිළිබඳව අර්ථ නිරූපනයක් දීමට පුළුවන. යම් නව පනතක් හෝ පවතින පනතක් සංශෝධනයේදී එය ජනතාවගේ මූලික අයිතිවාසිකම් කෙරෙහි බලපාන්නේ කෙසේ ද? යන්න පිළිබඳව අර්ථ නිරූපනය කර එය පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට අනුකූලද, නැතිද යන්න තීරණය කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි.

මේ අනුව තමන්ට අවශ්‍ය ලෙස නීති සම්පාදනය කිරීමට විධායකයට හෝ ව්‍යවස්ථාදායකයට නොහැකි වන්නේ එම නීතිවලින් ජනතාවගේ මූලික අයිතීන්ට වන බලපෑම අධිකරණය අධීක්ෂණය කරන නිසාය.

## රාජ්‍යයේ වගකීම් හා ආණ්ඩුවේ කාර්යභාරය

ජනතාව වෙනුවෙන් රාජ්‍යයට පැවරී ඇති වගකීම මෙහෙය වන්නේ පාලකයා ඇතුළු අනෙක් ජනතා නියෝජිතයින්ගෙන් සමන්විත ආණ්ඩුව විසිනි. රාජ්‍ය විසින් ජනතාවගේ අවශ්‍යතා එනම් ආහාර, නිවාස, ඇඳුම්-පැළඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍යය, ජනතාවගේ ආරක්ෂාව මෙන්ම ප්‍රවාහන හා සංනිවේදනය වැනි ඉටු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවෙන්ම බැඳී සිටියි. තවද එම කාර්යයන් ඉටු කිරීමට රාජ්‍යයට මුදල් අවශ්‍යය. රාජ්‍යයට මේ සඳහා ජනතාව බදු වශයෙන් මුදල් ගෙවීමක් සිදු කරන අතර එම බදු මුදල් වලින් මෙම අවශ්‍යතා සැපිරීමට අවශ්‍ය යටිතල ව්‍යුහය රාජ්‍යය වෙනුවෙන් ඉටුකරන්නේ ආණ්ඩුව විසින්ය.

එමෙන්ම රාජ්‍යය ජනතාවගේ සමාජ සුභසිද්ධිය සඳහා ඉඩකඩ සලවන්නේ, අන් අයට බාධාවක් නොවන ලෙස පුද්ගල නිදහස ද ඇතිවන ආකාරයෙන්ය. එනම් නිදහස් ජන ජීවිතයක් ගත කිරීමටත් නිදහසේ තමන් කැමැති අදහස් ප්‍රකාශ කිරීමටත්, ආගමික හා සමාජීය පසුබිමක ජීවත්වීමටත්, තමන්ට අවශ්‍ය පරිදි දරුවන් බිහි කරමින් තමන්ගේ කුටුම්භය පිළිබඳ තීරණ ගැනීමට ඇති නිදහස ආරක්ෂා කර දීම රාජ්‍යයේ වගකීමක් වනු ඇත.

## ජනතාවගේ සිවිල් ආගම

මේ අනුව රටක සැම පුරවැසියෙක්ම මෙම රාජ්‍යය යන සංකල්පය පිළිගත යුතුය. එමෙන්ම එයට අවනත විය යුතුය. රාජ්‍යයක ජීවත්වන පුද්ගලයින්ට ආගම් දෙකක් පවතින බවට දේශපාලන කියමනක් ඇත. එනම් සිවිල් ආගම හා ලෞකික නැතිනම් ලෝකායතන ආගමයි. සිවිල් ආගම පිළිගැනීම යනු ඔහු ජීවත්වන රටේ ආණ්ඩුක්‍රමය මගින් ප්‍රකාශිත රාජ්‍යයේ නීතින් හා අනුගතවීමයි. ලෝකායතන ආගම පිලිගැනීම යනු තමන් අදහන ආගමික ශාස්තෘවරුන් ඉදිරිපත් කර ඇති දේශනාවන්ගේ ඇති රීතීන්ට අනුගතවීමයි. පුද්ගලයෙක් තමන් පිලිගන්නා ලෝකායතන ආගමක රීතීන් පිළිගන්නේද නැද්ද යන්න තීරණය කළ හැකිය. එනම් ඔහුට ආගමික ජීවිතයක් හෝ අනාගාමික ජීවිතයක් ගත කළ හැකිය. නමුත් රටක කිසිදු පුරවැසියෙක්ට සිවිල් ආගම වන රාජ්‍යයේ නීතීන්ගෙන් මිදී කටයුතු කිරීමට නොහැකිය.

මෙම ලෞකික ආගම්වල මෙන්ම සිවිල් අගමේද අන්තර්ගතයේ ලිඛිත ප්‍රකාශන පවතී. එනම් බයිබලයය, ත්‍රිපිටකය, කුරානය, භගවත් ගීතාව වැනි ප්‍රකාශනයි. එසේම සිවිල් ආගමේ ප්‍රකාශනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු එහි ලිඛිත ප්‍රකාශනය වේ. එයට ගරු කිරීමට හා පිළිගැනීමට සියළු පුරවැසියන් අනිවාර්යයෙන් බැඳී සිටිති. මේ අනුව රාජ්‍යය යනු සැම පුරවැසියාටම පොදු දෙයකි. එමෙන්ම පොදුවේ පිළිගත යුතු දෙයකි. රාජ්‍යය ප්‍රතික්ෂේප කිරීමට පුරවැසියන්ට නොහැකිය. රාජ්‍ය ප්‍රතික්ෂේප කරන පුද්ගලයා යනු සාමාජයේ අන් පුද්ගලයෙක්ගේ අනන්‍යතාවයට සෘජු හෝ අනියම් ලෙස අහිතකර බලපෑම් කරන පුද්ගලයෙකි. මේ නිසා කිසිදු රටක පුද්ගලයෙක්ට එරට ආණ්ඩුක්‍රමයෙන් ප්‍රකාශිත මූලික නීතියෙන් හා එම මූලික නීතිය බල ගැන්වීමට ඇති අනුසාංගික නීතීන්ගෙන් පිටත කටයුතු කිරීමට නොහැකිය.

## නිවැරදි තීරණයන් ගැනීමේ වැදගත්කම

නීතිය යනු දේශපාලනික, ආර්ථික හා සමාජ පද්ධතිය මෙහෙයවමින් මිනිසාගේ දේශපාලනික හැසිරීම්, ආර්ථික හැසිරීම් හා සමාජ හැසිරීම් පාලනය කරන උපකරණයයි. එබැවින් නීතිය නැමති උපකරණයට හසුවන ඕනෑම පුද්ගලයෙක් දේශපාලනික සත්වයෙකි, ආර්ථික සත්වයෙකි, සමාජ සත්වයෙකි.

එම නිසා අපි දේශපාලනයට කැමැති නැහැ අපි ඡන්දය දෙන්නේ නැහැ. 225ම එපා වැනි ප්‍රකාශ වූ කලී පුද්ගලබද්ධ කරුණු මිස ප්‍රායෝගික යථාර්තය නොවේ. සමාජයක් යනු සවිංඥානිකව බලය මෙහෙයවීමටත්, ආර්ථිකය මෙහෙවීමටත් හැකි බුද්ධිමතුන් තෝරාගැනීමට කටයුතු කරන ජන කණ්ඩායමක් විනා පුහු සටන් පාඨවලට යටත්ව තීරණ ගෙන පසුව පශ්චාත්තාප නොවිය යුතු ජන කණ්ඩායමක් විය යුතුය. මේ ගැන වර්තමානය වන විට අප බොහෝ දේ ලාංකීය සමාජයෙන්ම ඉගෙන ගෙන ඇත. එබැවින් නූතන ශ්‍රී ලංකීය රාජ්‍යය ගොඩනැගීම යනු පුරවැසියන් හුදු වාසි අවාසි හමුවේ දේශපාලනික මතවාදයන්ට යටත්වීමකින් තොරව සබුද්ධිකව හා තර්කාණුකුලව තීරණ ගනිමින් කළ යුතු කාර්යයකි.

*මෙම ලිපිය සකස් කිරීමේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය අභාවප්‍රාප්ත මහාචාර්ය අමරසිරි සොයිසා මහතාගේ දේශනවල මතක සටහන් පාදක කරගත් බව සඳහන් කරන්නේ ඔහුට කරන ගෞරවයක් වශයෙනි.*

සරත් හේවගේ

# එක් තීරයක්-එක් මාවතක් සහ එක් නායකත්වයක්




ගෝලීය භූ-දේශපාලනය මේ දිනවල වඩාත් උණුසුම්ව තිබේ. යුක්රේන්-රුසියා යුද්ධය ගෝලීයව අර්බුද මතුකරමින් තිබියදී පලස්තීන-ඊශ්‍රායල් යුද්ධය තවත් පියවර ගණනාවකින් තත්වයන් ගිණියම් කිරීමට සමත්ව තිබේ. මේ අතර ඇමරිකාව ප්‍රමුඛව බටහිර කඳවුරේ ගෝලීය පිළිවෙත වූ නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමය මත පදනම් වූ වොෂින්ටන් සම්මුතිය බැහැර කරමින් ආරක්ෂණවාදී පිළිවෙතක් වෙත මාරුවීමේ නව සම්මුතිය ප්‍රකාශයට පත් කිරීමත් භූ-දේශපාලනික අර්බුදය සමතයකින් තොරව අනාගතය සඳහා රැගෙන යාමක් ලෙස පෙන්නුම්කර තිබේ. විශේෂයෙන්ම චීනයේ නැඟී සිටීම පාලනය කිරීම වෙනුවෙන් ගත් පියවරක් ලෙස මේ නව සම්මුතිය හඳුනාගත හැකිය. එහෙත් බටහිර කඳවුරේ ප්‍රතිවාදියාව සිටින චීනය බටහිර කඳවුරේ අභියෝගය භාර ගනිමින් තමන්ගේ පිළිවෙත වඩාත් ශක්තිමත් කිරීම වෙනුවෙන් මේ වන විට පියවර ගන්නාවක් දියත් කර ඇත. චීනයේ Belt and Road Initiative (BRI) වැඩපිළිවෙල යනු එහි මහා සංග්‍රාමය ලෙස හැඳින්විය හැකි ක්‍රියාන්විතයකි.

පසුගිය කාලය මුළුල්ලේ ගෝලීය භූ-දේශපාලනික අර්බුද සමඟ ගැටෙමින් සිටි ජනාධිපති රනිල් වික්‍රමසිංහ පසුගියදා චීනයේ සිව්දින නිල සංචාරයක් සඳහා පිටත්ව ගියේ මෙම BRI වැඩපිළිවෙල යටතේ වන "එක් තීරයක් - එක් මාවතක්" (One Belt -One Road) ජාත්‍යන්තර සමුළුවට සහභාගීවීමත් වෙනුවෙනි. පසුගිය ඔක්තෝබර් 17 හා 18 යන දෙදින චීනයේ බීජිං අගනුවරදී පැවැත්වූ මෙම සමුළුව "එක් තීරයක් - එක් මාවතක්" සමුළුවේ තුන්වන සමුළුවයි. එමෙන්ම මෙම වැඩසටහනේ දසවන සංවත්සරය ද මෙවසරට යෙදී තිබේ. 2013 වසරේදී චීන ජනාධිපති ෂී ජින්-පින් මහතාගේ ප්‍රධානත්වයෙන් ඇරඹි "එක් තීරයක් - එක් මාවතක්" මෙවර වැඩසටහන සඳහා රටවල් 130ක් හා ජාත්‍යන්තර සංවිධාන 30කට අධික ප්‍රමාණයක් එක්ව ඇත.

"එක් තීරයක් - එක් මාවතක්" වැඩපිළිවෙල චීන රජය විසින් ගෝලීයව දියත් කරන ලද දැවැන්ත යටිතල පහසුකම් සහ ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියකි. ආසියාව, යුරෝපය සහ අප්‍රිකාව අතර වෙළඳ හා ආයෝජන සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම මෙහි ප්‍රධානතම අරමුණයි. මෙහි සමාරම්භක අවස්ථාවේදී චීන ජනාධිපති ෂී ජින් පිං මහතා පැවසුවේ "සේද මාවතේ ආර්ථික තීරය" සහ "21 වැනි සියවසේ මුහුදු සේද මාවත" පොදුවේ ගොඩනැගිය යුතු බවයි. මෙම වැඩපිළිවෙල වෙනුවෙන් අවම වශයෙන් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 4ක් වැය වනු ඇති බවට ගණන් බලා ඇති අතර, මෙම ව්‍යාපෘතිය හරහා ආවරණය වන රටවල් අනුව ලෝක ජනගහණයෙන් 60%ක් ආවරණය වනු ඇත.

ක්‍රි.පූ. දෙවන සියවසේ සිට සක්‍රීයව භාවිත කෙරුණු කිලෝමීටර් 6,400ක් පමණ දිගු දුරකින් යුත් ඉපැරණි සේද මාවත පෙරදිග හා බටහිර යාකරමින් ආර්ථික, දේශපාලනික, සංස්කෘතික අන්තර් සම්බන්ධතා ගොඩනැගුණු වැදගත් සන්ධිස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය. මෙම ඉපැරණි සේද මාවත මුල් කරගත් නව එක් තීරයක් එක් මාවතක් ව්‍යාපෘතිය ගොඩබිමින් හා සාගරය හරහා විහිදී ඇති උපාය මාර්ගික ලෙස වැදගත් ආර්ථික මර්මස්ථාන සම්බන්ධ කරමින්, ඒවා ශක්තිමත් කිරීම අරමුණ කෙරිණි. මෙහිදී ගොඩබිම පදනම් වූ ක්‍රියාවලිය මධ්‍යම ආසියාව, රුසියාව, නැගෙනහිර යුරෝපය, බටහිර යුරෝපය, එංගලන්තය සහ මැද පෙරදිග හරහා චීනය යුරෝපයට සම්බන්ධ කරනු ලබන දුම්රිය හා මාර්ග පද්ධතියක් යෝජනා කර තිබූ අතර, මෙයට අමතරව තෙල් හා ගෑස් නල පද්ධතියක් ද ඉදිකිරීම ඇතුළත්ව ඇත. සමුද්‍රීය සේද මාවත ක්‍රියාවලියේදී චීනය නැගෙනහිර ආසියානු රටවල් සියල්ල, ඉන්දියානු සාගර කලාපයේ රටවල් සියල්ල, නැගෙනහිර අප්‍රිකානු රටවල් හා යුරෝපයට එකට සම්බන්ධ කරන පැරණි සේද මාවතට සමගාමී නාවුක මාර්ගයක් ගොඩනැගෙනු ඇත.

මෙම වැඩපිළිවෙල මඟින් ජාත්‍යන්තර වෙළඳාම හා ආර්ථික කටයුතු පහසු කෙරන අතර, කඩිනම්, වඩාත් ලාභදායී සහ ඵලදායී සේවාවන් රැසක් වෙනුවෙන් ඉඩකඩ සලසාලනු ඇත. එමෙන්ම මෙම ක්‍රියාවලිය හරහා දැවැන්ත ගෝලීය සැපයුම් ජාලයක් නිර්මාණය කෙරෙන අතර, මෙමගින් සමස්ත ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් වැඩි අවස්ථාවන් උදා කර දෙනු ඇත.

මේ වන විට මෙම වැඩපිළිවෙල හා ශ්‍රී ලංකාවද සම්බන්ධ වී සිටින අතර මෙහිදී ශ්‍රී ලංකාව යනු සමුද්‍ර සේද මාවතේ අතිශය වැදගත්ම සංධිස්ථානයක්ද වේ. එසේම මේ හරහා මෙරටට අත්පත් කරගත හැකි ප්‍රතිලාභ ගණනයේදී ඒ අතිමහත් වෙනු ඇත. එය ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධනය සම්බන්ධයෙන් තීරණාත්මක ද වෙනු ඇත. ජනාධිපති වික්‍රමසිංහ ලොව පස්වන ආර්ථිකය හිමි ඉන්දියාව සමඟ ඉන්දියානු සාගර කලාපීය සම්බන්ධතා ගොඩනගමින් කලාපීය සහසම්බන්ධිත ආර්ථික උපාය මාර්ගික මෙහෙයුමක නිරතව සිටින අතරතුර ලොව දෙවන විශාලතම ආර්ථිකය හිමි චීනයේ BRI වැඩපිළිවෙල හා එක්ව එහි ප්‍රතිලාභයන් මෙරටට මෙන්ම මෙම කලාපයට අත්පත්කර දීමේ මෙහෙයුමකද යෙදී සිටී.

මේ අතර වඩාත් ප්‍රමුඛ කරුණ වන්නේ ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා ආයෝජන අවස්ථාවන් හිමිකර ගැනීමට හැකිවීමයි. මෙම ආයෝජන අවස්ථා අතර වරාය, මාර්ග, දුම්රිය මාර්ග, ගුවන් තොටුපළ සහ විදුලි බලාගාර සංවර්ධනය ද මෙයට ඇතුළත්ව තිබීම සුවිශේෂීය. නිදසුනක් වශයෙන්, හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය යන දෙකම එක් තීරයක් එක් මාවතක් ව්‍යාපෘතියෙහි කොටසක් වන අතර, එය සැලකිය යුතු අන්දමේ දැවැන්ත චීන ආයෝජනයකි.

මෙම ව්‍යාපෘතිය හරහා ගෝලීය සම්බන්ධතාවය වඩාත් තහවුරු කෙරෙන අතර, අනෙකුත් රටවල් සහ කලාප සමඟ සම්බන්ධතා වැඩිදියුණු කිරීම නිතැතින්ම සිදුවේ. මෙමගින් වෙළෙඳ හා ප්‍රවාහන සම්බන්ධතා වැඩිදියුණු කළ හැකි අතර, ඉන්දියන් සාගරයේ උපාය මාර්ගික කේන්ද්‍රස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවට සේවය කිරීමට හැකි වේ. වැඩිදියුණු කළ සම්බන්ධතා මගින් භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැලසීමට, විදේශ සමාගම්වල ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හැකියව ඇත.

එසේම මෙම ව්‍යාපෘතිය මඟින් ඇති කරන පුද්ගල සංචරණය හා සංස්කෘතික සංචරණය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සංචාරක සහයෝගීතාව ප්‍රවර්ධන කෙරෙහි මහඟු දායකත්වයක් ඇති කර ගත හැකි වනු ඇත. ශ්‍රී ලංකාවේ ආකර්ෂණීය සංචාරක කලාප වෙත ගෝලීයව සංචාරකයින් ආකර්ෂණය කර ගත හැකි වනු ඇති අතරම, සංචාරක කර්මාන්තය නංවාලීමට සහ නරඹන්නන්ගේ පැමිණීම වැඩි කිරීම තුළින් විදෙස් විනිමය ආදායම් උපයා ගත හැක.

එසේම ගෝලීය වෙළඳ පහසුකම් ප්‍රවර්ධනය මේ හරහා අදාළ කර ගත හැකි වන අතර, මෙම ව්‍යාපෘතිය තුළ සහභාගී වන රටවල් අතර වෙළඳ බාධක අඩු කිරීම ප්‍රධාන අරමුණක් වන බැවින් ඒ හරහා චීනය, මධ්‍යම ආසියාව සහ යුරෝපය ඇතුළු තීරය සහ මාර්ග ඔස්සේ ගෝලීය රටවල් වෙත වෙළඳපල ප්‍රවේශය වැඩිදියුණු කිරීමෙන් ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ ලැබිය හැකිය. මෙය අපනයන වැඩි කිරීමට, වෙළඳ හවුල්කරුවන් විවිධාංගීකරණය කිරීමට සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නව වෙළඳපල වෙත ව්‍යාප්ත කිරීමට හේතු විය හැක. එපමණක් නොව BRI ව්‍යාපෘතිය හරහා වැඩිදියුණු කළ සම්බන්ධතාව මඟින් ශ්‍රී ලංකාවට ආසියාවේ සහ යුරෝපයේ වෙළඳපොළ වෙත වැඩි ප්‍රවේශයක් ලබා දිය හැකි අතර, ස්ථාවර වෙළඳ අවස්ථා පුළුල් කිරීම සහ රටේ ආර්ථික හවුල්කාරිත්වයන් විවිධාංගීකරණය කළ හැකිය. එසේම මෙම ව්‍යාපෘතිය හා එක්වීම මඟින් ශ්‍රී ලංකාවට විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කරගැනීමේ විශාල ඉඩකඩක් විවර වෙනු ඇත.

මෙහි ශ්‍රී ලංකාවට ලැබෙන තවත් සුවිශේෂී අවස්ථාවක් වන්නේ මෙම BRI ව්‍යාපෘති මඟින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ රැකියා අවස්ථා නිර්මාණය කිරීමට ඇති හැකියාවයි. දේශියව යටිතල පහසුකම් සංවර්ධනය ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කරන අතර, ඉදිකිරීම් අංශයේ රැකියා උත්පාදනය සහ ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා සුවිශේෂී දායකත්වයක් මෙමගින් අපේක්ෂා කළ හැකිය.

මේ අනුව මෙම ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලංකාවට සලසා ගත හැකි අවස්ථාවන් අපමණ බව පැහැදිලිය. මේ මොහොතේ කුඩා ආර්ථිකයකට හිමිකම් කියන්නා වූ රටවල්වලට BRI වැනි අවස්ථාවන් මඟින් ආර්ථික වර්ධනයට අවශ්‍ය සහයෝගය ලබාගැනීම උපක්‍රමිකව ඉතා වැදගත්ය. නමුත් මෙහි සැබෑ වාසිය අත්පත්කර ගැනීමට තරම් පාලකයන් සූක්ෂම විය යුතුය. මෙරට සම්බන්ධයෙන් ඇති අභියෝග ගණනාවකි.

ව්‍යාපෘති සඳහා ලබා ගන්නා චීන ණය ආපසු ගෙවීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සැලකිය යුතු කරුණකි. පැහැදිලි ආපසු ගෙවීමේ සැලැස්මක් නොමැතිව රට අධික ලෙස ණය ලබා ගන්නේ නම්, එය උගුලක් වීම වැලැක්විය නොහැක. ව්‍යාපෘතිවලින් ප්‍රමාණවත් ආදායම් උත්පාදනය නොකිරීම හෝ අපේක්ෂිත ප්‍රතිලාභ ප්‍රමාද වීම මෙම අභියෝගය තවත් උග්‍ර කළ හැකිය. එවැනි අත්දැකීම් මේ වන විටත් රටට තිබේ. ශ්‍රී ලංකාවේ ණය සහ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය තුලනය කර ගැනීමට, විනිමය අනුපාත අවදානම් කළමණාකරණයට සමත් විය යුතුය. එමෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ කොන්ත්‍රාත් කොන්දේසිවල විනිවිදභාවය දූෂණය වැලැක්වීමට, පිරිවැය-ඵලදායීතාවය සහතික කිරීමට සහ අධික මිල හෝ වැරදි කළමනාකරණයේ අවදානම අවම කිරීමට සමත් විය යුතුය. මේ අනුව රාජ්‍ය ප්‍රතිපත්තීන් සහ රජයේ විචක්ෂණ මූල්‍ය කළමනාකරණය නිසි ආකාරයේන් පවත්වාගෙන යන්නේ නම් අභියෝග ජය ගත හැකිය. චීන ණය උගුලක පැටලීම වන්නේ නැත. කොහොමත් චීන ණය උගුල ජනප්‍රිය චෝදනාවක් වන නමුදු චීනයට එවැනි ණය උගුල්වලින් ලෝකයේ රටවල් තම අණසක තුළ පවත්වා ගැනීම කළ නොහැකි බව තේරුම් ගත යුතුය.

මේවා කාලෙන් කාලෙට එන කතන්දරය. ඇමරිකාව හෝ බටහිර රටක් සංවිධානයක් සමඟ ගනුදෙනු කරන විට එය බටහිර අධිරාජ්‍යවාදී බූවල්ලාට යටවීමකි. ඉන්දියාව සමඟ ගනුදෙනුව ඉන්දියානු ව්‍යාප්තවාදයේ වඳුරාට යටවීමකි. චීනය සමඟ නම් චීන රතු මකරාට යටවීමකි. නමුත් වැදගත්ම දේ මේ සියළු පාර්ශ්ව සමඟ සමාන ගනුදෙනුවක් කරමින් ඒ සියල්ල රටේ වාසියට යොදා ගැනීමට හැකි වීමය. ඒ වාසිය ගන්න නම් මේ ගනුදෙනුව නිවැරදිව කළ හැකි නායකත්වයක් රටකට අවශ්‍යය. එසේම පෙර කී ලෙස රාජ්‍ය ප්‍රතිපත්තීන් සහ රජයේ විචක්ෂණ මූල්‍ය කළමනාකරණයට රට සූදානම් කිරීම ඒ වෙනුවෙන් දැක්මක් ඇති අධිෂ්ඨානශීලී අවංක නායකත්වයක් අවශ්‍යය. ජාත්‍යන්තර වශයෙනුත් අභ්‍යන්තර වශයෙනුත් රටට වාසිදායක වර්ධනයන් පෙළගැසෙද්දී රටට අත්‍යාවශ්‍යම සුදුසු නායකත්වය යන කොන්දේසිය අද රනිල් වික්‍රමසිංහ විසින් පූර්ණ කර ඇත. මේ අනුව අනාගතය දෙස සුබවාදීව බැලීම හැර වටපිට බලන්නට අවශ්‍යතාවයක් නැත.

කොහොම නමුත් ශ්‍රී ලංකාවට, චීනය සමඟ ඇති වසර දහස් ගණනක ඓතිහාසික සම්බන්ධතාවය වර්ධනය කරගනිමින් චීන රජයේ සහයෝගය තවදුරටත් මෙරටට ලබා ගැනීමට ජනාධිපතිවරයා සමත්ව තිබිණි. මෙහිදී ජනාධිපතිවරයාගේ සෙසු රාජ්‍ය නායකයන් සහ ජාත්‍යන්තර සංවිධාන ප්‍රධානීන් විශාල ප්‍රමාණයක් සමඟ සාර්ථක සාකච්ඡා වට ගණනාවක් පවත්වමින් රටේ තවත් අවශ්‍යතාවයන් ගණනාවක් විසඳා ගැනීමට මූලික පියවරයන් ගෙන තිබිණි. ගිවිසුම් ගණනාවකට එළැඹෙමින් රටට බොහෝ දේ රැගෙන විත් තිබිණි.

එබැවින් හුදු චීන විරෝධයක් හෝ බටහිර විරෝධයක් හෝ නඩත්තු කරමින් බාල ජනප්‍රිය දේශපාලනයක යෙදෙනවා වෙනුවට සියලු පාර්ශ්ව සමඟ රටට වඩා හොඳ ප්‍රතිලාභ ලබාගත හැකි සහ විශ්වාසවන්ත වැඩපිළිවෙළක් හා එක්වීම මඟින් රට ඉදිරියේ ඇති අභියෝග ජය ගැනීමේ මාවත විවර කරගැනීමට හැකි බව ජනාධිපතිවරයා පෙන්වා ඇත.

එකිනෙකාට එරෙහිව යමින් අනෙකා යටපත් කරනු වෙනුවට සියලුදෙනා අත්වැල් බැඳ ගනිමින් එකිනෙකාගේ සහයෝගය ඇතිව නැඟී සිටීම මේ රට සම්බන්ධයෙන් පමණක් නොව මේ මොහොතේ ගෝලීය කාර්යභාරය වනු ඇති බවත් ජනපති රනිල්ගේ දැක්මය. ඔහු ඊට දක්වන සමත්කම විසින් පෙන්වා දෙන්නේ ජනපති රනිල් වික්‍රමසිංහගෙන් පසුත් මේ රටට ඇවැසි නායකත්වය රනිල්ම පමණක් බවය. රට ගොඩනැගිය හැක්කේ එවැනි නායකත්වයක් යටතේ පමණකි.

රිද්මා අනුරාධ ගමගේ

# දේශගුණික විපර්යාස නිසා දරුවන් මිලියන 43 ක් අවතැන්

දේශගුණික විපර්යාස මත ක්‍රමයෙන් වැඩිවන දැඩි කාලගුණික වෙනස්වීම් මගින් ළමුන් මිලියන 43කට වඩා වැඩි පිරිසක් අවතැන් කර තිබෙන අතර ඉදිරි වසර 30 තුළ තවත් මිලියන 100ක් අවදානමට ලක්විය හැකි බව UNICEF වාර්තාවක් පෙන්වා දෙයි.

දේශගුණික විපර්යාස තවදුරටත් ලෝකයටම දුරස්ථ තර්ජනයක් නොවන අතර එය සැමතැන සහ මෙම මොහොතේත් සිදුවෙමින් පවතින දෙයකි. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ (UNICEF) නව වාර්තාවක් දේශගුණික අර්බුදයට සම්බන්ධ ආන්තික කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ලොව පුරා මිලියන සංඛ්‍යාත දරුවන් තම නිවෙස්වලින් උදුරා දමන හද කම්පා කරවන යථාර්ථය ඉස්මතු කරතිබේ. 2016 සිට 2021 දක්වා කාලය තුළ පමණක් ළමුන් මිලියන 43කට අධික සංඛ්‍යාවක් අවතැන්වීම් අත්විඳ ඇති අතර කඩිනම් පියවර නොගතහොත් ඉදිරි දශක තුන තුළ මෙම සංඛ්‍යාව මිලියන 100ක් දක්වා වර්ධනය විය හැකි බව මෙම වාර්තාවෙන් අනුමාන කරයි.



### දරුවන්ගේ සැඟවුණු දුක්ඛිත තත්ත්වය

දේශගුණික විපර්යාසවල බලපෑමට වඩාත්ම අවදානමට ලක්විය හැකි අය අතර ළමුන් ප්‍රමුඛ වේ. නමුත් ඔවුන්ගේ අත්දැකීම් බොහෝ විට අවධානයට ලක් නොවේ. යුනිසෙෆ් වාර්තාව, අභ්‍යන්තර විස්ථාපන නිරීක්ෂණ මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන්, මෙම සැඟවුණු අර්බුදය ආලෝකයට ගෙන ඒම අරමුණු කර ගෙන ඇත. දේශගුණික විපත් මත සිදුවන අභ්‍යන්තර අවතැන්වීම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් දරුවන් අසමාන ලෙස පීඩාවට පත්ව ඇති බව මෙමඟින් හෙළි වේ.

### ආපදා වර්ග සහ ප්‍රධාන සොයාගැනීම්

මෙම හද කම්පා කරවන අවතැන්වීම්වලට තුඩු දුන් ප්‍රධාන දේශගුණික විපත් වර්ග හතරක් වාර්තාව ගෙනහැර දක්වයි. ගංවතුර, කුණාටු, නියඟ සහ ලැව්ගිනි හඳුනා ගෙන ඇති අතර සංඛ්‍යා විශ්මයජනක වන අතර බලපෑම් ගැඹුරු ය.

2016 සිට 2021 දක්වා කාලය තුළ රටවල් 44ක ළමුන් මිලියන 43.1ක් මෙම දේශගුණික විපත් හේතුවෙන් අවතැන් විය.

ගංවතුර සහ කුණාටු මූලික හේතුන් වූ අතර, අවතැන්වීම්වලින් සියයට 95 (මිලියන 40.9) එමගින් සිදු විය.

නියඟය හේතුවෙන් ළමුන් මිලියන 1.3කට වැඩි පිරිසකට ඔවුන්ගේම නිවෙස් සහ ගම්රටවල් හැර යාමට සිදුව තිබිණි.

කැනඩාව, ඊශ්‍රායලය සහ එක්සත් ජනපදය තුළ කැපී පෙනෙන බලපෑම් ඇති වූ ලැව් ගිනි හේතුවෙන් ළමුන් 810,000කට ආසන්න ප්‍රමාණයක් අවතැන් විය.

### ගෝලීය වැඩි බලපෑම් සහිත රටවල්

මෙම අර්බුදය ලොව පුරා දරුවන්ට බලපාන නමුත් සමහර රටවලට එහි වැඩි බර දරා ගැනීමට සිදුව ඇත. වැඩිම දරුවන් සංඛ්‍යාවක් අභ්‍යන්තර අවතැන් වූ රටවල් අතර චීනය සහ පිලිපීනය විය. කුණාටු තත්වයන් විශේෂයෙන්ම ඩොමිනිකා සහ වනුවාටු වැනි කුඩා දූපත් රාජ්‍යයන්ට සිදුව ඇති විනාශකාරී වී බලපෑම් වැඩි බව වාර්තාව අවධාරණය කරයි. ඊට වෙනස්ව සෝමාලියාවේ සහ දකුණු සුඩානයේ දරුවන් ගංවතුරෙන් දැඩි ලෙස පීඩාවට පත් විය.

### දරුවන්ට ඇති මනෝවිද්‍යාත්මක බලපෑම

UNICEFහි විධායක අධ්‍යක්ෂ කැතරින් රසල් මෙම අවතැන්වීම් අත්විඳින දරුවන්ට සිදුවන චිත්තවේගීය හා මානසික හානිය අවධාරණය කරයි. එය ලැව් ගින්නක්, බලවත් කුණාටුවක් හෝ විනාශකාරී ගංවතුරක් වේවා, ඔවුන් මුහුණ දෙන භීතිය සහ අවිනිශ්චිතභාවයන් අතිශය දුක්ඛිත වේ. මෙම දරුවන්ගේ ජීවිත කඩාකප්පල් වී ඇති අතර, ඔවුන් කවදා හෝ ආපසු නිවසට පැමිණියද, ඔවුන්ගේ අධ්‍යාපනය දිගටම කරගෙන යනු ඇත්ද, නැතහොත් තවත් පෙරළියකට මුහුණ දෙයිදැයි ඔවුන්ට කල්පනා කරන්න සිදුවෙනු ඇති බව ඇය පෙන්වා දෙයි.

### විසදුම් සඳහා හදිසි සිහි කැඳවීමක්

දරුවන් සඳහා වර්ධනය වන මෙම අභියෝගයට අප මුහුණ දෙන වේගය පිළිබඳව රසල් සිය කනස්සල්ල පළ කළාය. දේශගුණය මත පදනම් වූ අවතැන්වීම් හේතුවෙන් පීඩාවට පත් දරුවන් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ට සහාය වීමට කඩිනමින් ක්‍රියා කළ යුතු බව ද ඇය අවධාරණය කරයි. දේශගුණික විපර්යාසවල බලපෑම් උත්සන්න වන විට, දරුවන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව පිළිබඳ අවදානම තීව්‍ර වේ. රසල් පෙන්වා දුන්නේ මෙම ගැටලුව විසඳීමට අවශ්‍ය දැනුම සහ මෙවලම් අප සතුව ඇති නමුත් කඩිනම් සහ පුළුල් ක්‍රියාමාර්ග ඉතා වැදගත් බවය.

### අපගේ පෘථිවිය සහ එහි ලාබාලතම වැසියන් ආරක්ෂා කිරීම

කොහොම නමුත් මේ වන විට මෙම UNICEF වාර්තාව අපව නින්දෙන් අවදි කිරීමේ ඇමතුමක කාර්යය ඉටු කර ඇත. දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීමේ හදිසි අවශ්‍යතාවය සහ එහි ඍජු ප්‍රතිවිපාක ළමයින්ට බලපාන බව ඉස්මතු කර ඇත. දේශගුණික විපර්යාසයන්ට එරෙහිව සටන් කිරීමට ලෝකය එක්විය යුතුය. පෘථිවිය පාරිසරික අර්බුදය විසඳා ගැනීම වෙනුවෙන් පමණක් නොව, මිලියන ගණනක් අහිංසක දරුවන් අවතැන් වීමේ කම්පනයෙන් ගලවා ගැනීම සහතික කිරීම සඳහා ද ලෝකය එක් විය යුතුය. එය අප සැමගේ වගකීමක් වන අතර ඒ සඳහා ක්‍රියා කිරීමට කාලය දැන් එළඹ ඇත. ප්‍රජාවන් සූදානම් කිරීමට, අවදානමට ලක්ව ඇති දරුවන් ආරක්ෂා කිරීමට සහ දැනටමත් උන්හිටි තැන් උදුරා දමා ඇති අයට සහාය වීමට අපගේ උත්සාහයන් ශක්තිමත් කළ යුතුය. එසේ කිරීමෙන් අපට ඉදිරි පරම්පරාවන්ට වඩා දීප්තිමත් හා ස්ථාවර අනාගතයක් ලබා දිය හැකිය.

නිරෝෂන් පෙරේරා

# ජූලියන් අසාන්ජ් රෝමයේ විශේෂ පුරවැසියෙකු ලෙස නම් කෙරේ

විකිලීක්ස්හි නිර්මාතෘ ජූලියන් අසාන්ජ්ව ගෞරවනීය පුරවැසියෙකු කරමින් විශේෂ ගෞරවයක් පිරිනැමීමට රෝම නගරය ඉතා කාලෝචිත සහ වැදගත් තීරණයක් ගෙන ඇත. රෝමයේ නගරාධිපතිනිය ලෙස පෙර කටයුතු කළ Virginia Raggi මෙම යෝජනාව පළමුව ඉදිරිපත් කළ අතර පසුව එයට විවිධ පක්ෂවල දේශපාලනඥයින්ගේ සහයෝගය ලැබිණි. රෝමයේ නගර සභාව යෝජනාවට පක්ෂව ඡන්දය දීමෙන් පසුව මෙම තීරණය ගෙන ඇත.




ජූලියන් අසාන්ජ් 2019 සිට මේ දක්වා ලන්ඩන්හි අධි-ආරක්ෂිත බන්ධනාගාරයක රඳවා තබා සිටී. 2010 දී අතිශය රහසිගත එක්සත් ජනපද හමුදා ලේඛන සහ රාජ්‍ය තාන්ත්‍රික පණිවිඩ ප්‍රසිද්ධ අවකාශයට (විකිලීක්ස් වෙබ් අඩවියට) මුදා හැරීම සම්බන්ධයෙන් ඔහුව එරෙහිව අමරිකාව චෝදනා කළේය. ඒ අනුව ඔහුව නඩු විභාගයකට ලක් කර දඬුවම් පැමිණවීම සඳහා එක්සත් ජනපදයට ඔහුව අවශ්‍යව තිබේ. ඔහුගේ ආධාරකරුවන් විශ්වාස කරන්නේ මෙය පුවත්පත් කලාවට සහ භාෂණයේ නිදහසට පහර දීමක් බවය. ඔහුගේ ක්‍රියාව, ජීවිත අනතුරේ හෙළන බව එක්සත් ජනපදය තර්ක කරන අතර ඒ සදහා ඔහුට දඬුවම් හිමි විය යුතු බව ඔවුන්ගේ මතයයි.

එහෙත් 2016 සිට 2021 දක්වා රෝමයේ නගර ආණ්ඩුවට නායකත්වය දුන් Raggi පැහැදිලි කළේ, "සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයේ **නිදහස් භාෂණයේ වැදගත්කම අසාන්ජ් නියෝජනය කරයි. ඔහුට වසර ගණනාවකට දුෂ්කර කොන්දේසි යටතේ ඔහුගේ නිදහස ප්‍රතික්ෂේප කර ඇත."** යනුවෙනි.

අසාන්ජ් ගෞරවනීය පුරවැසියෙකු කිරීමේ තීරණය අඟහරුවාදා අනුමත කරන ලද අතර ඔහුට මෙම විශේෂ තත්ත්වය ලබා දීමේ නෛතික ක්‍රියාවලිය දැන් සිදුවෙමින් පවතී. මෙම ක්‍රියාවලිය නත්තල වන විට අවසන් කළ හැකි යැයි බලාපොරොත්තු වන නමුත් එය ඊට වඩා තරමක වැඩි කාලයක් වුව ගත විය හැකි බවද පැවැසේ.

මෙම පියවර ගත් ඉතාලියේ එකම නගරය රෝමය නොවේ. පසුගිය මාසයේදී ඉතාලියේ උතුරේ රෙජියෝ එමිලියා නගරය ද අසාන්ජ් පුරවැසියෙකු බවට පත් කළ අතර ඉක්මනින්ම නේපල්ස් නගරය ද එවැනි තීන්දුවක් ගැනීමට සැලසුම් කරමින් සිටින බවත් වාර්තා වේ.

අසාන්ජ් එක්සත් ජනපදයට යවනු ලැබුවහොත්, එල්ල වී ඇති චෝදනා අනුව ඔහුට අධි-ආරක්ෂිත බන්ධනාගාරයක වසර 175ක පමණ සිර දඬුවමකට මුහුණ දීමට සිදුවනු ඇතැයිද පැවසේ.

නිරෝෂන් පෙරේරා

# ශික්ෂණයක් නැති සමාජයක්




ඕනෑම සමාජයක අනාගත පැවැත්ම තීරණය වන්නේ ඒ වෙනුවෙන් සමාජීය පුද්ගලයන් ශික්ෂණය කිරීම සිදුවන ප්‍රමාණය සහ ආකාරය අනුවයි. ඒක ගණ ගෝත්‍ර යුගයේදිත් අදත් එහෙමයි. හැබැයි ශික්ෂණය කියන එක ඒ ඒ සමාජයේ වුවමනාවන්ට සාපේක්ෂ දෙයක්. අද රටක අධ්‍යාපන ක්‍රමය කියන්නේ ඒ ශික්ෂණයේ ප්‍රතිපත්තිමය ඒකාග්‍රතාවයට. මේකෙදි බාලයන් ශික්ෂණය කරන කොට ඊට සම්මාදම් වෙන ශික්ෂකයා නැතිනම් ගුරුවරයා ශික්ෂණය වී තිබීම ගොඩක් වැදගත්. ඒක ආදර්ශයෙන්ම පෙන්වන්න පුළුවන් වෙන්න ඕන. එහෙම නැතිනම් එයා කරන වැඩේ හොඳම ප්‍රතිඵලය ලැබෙන්නේ නැති වෙන්න පුළුවන්. ඒක ගැන බාලයන්ට දොස් කියලත් වැඩක් නැහැ. පාසලක් බිහිවන විට හිරගෙයක් වැහෙනවා කියන්නේ ඒක තවත් විදිහකට කියන එක. වැරදි නොකරන සමාජයක් ඇති වෙන්න නම් වැරදි නොවන තැනට ශික්ෂණයක් සමාජයට තියෙන්න ඕන. ඒ කියන්නේ විනය හැම දෙනාටම තියෙන්න ඕන. විනය කියන එක හැදෙන්නේ තමන් තමන්ටම ස්වයං වාරණයක් දා ගැනීම තුළයි. ඒ කියන්නේ වල්බූරු නිදහස අත්හැරලා අනෙක් එකාගේ නිදහස වඩා වැදගත් වගේම ඒක රැකදීම තමාගේ වගකීම කියලා හිතල පතල වැඩකරන එක. එහෙම අනිත් එකා ගැන හැම දෙනාම හිතන කොට තමන්ගේ ආරක්ෂාව වගේම නිදහසත් අනෙක් අය රැක දීලා අපි දන්නෙවත් නැතුව.

ගුරුවරයා විසින් ලබා දිය යුතු ආදර්ශය වගේම ඉගැන්විය යුතු දහමත් ඒකයි. අද ගුරුවරයා කියන්නේ වෘත්තිකයෙක්. ඒ නිසා ගුරුවරයාගේ භාවිතයට වෘත්තීමයභාවයක් තිබෙනවා. ඒ වෘත්තීමයභාවය තීරණය වන්නේ බාලයන් ශික්ෂණය කිරීම කියන රාජකාරිය අනුව. මේ නිසා තමන්ගේ නිදහසය, තමන්ගේ අභිමතයය, තමන්ගේ මානව හිමිකමය කියලා පිස්සු කෙළීමේ අවසරයක් ඒ වෘත්තීයභාවය ඇතුලේ ගුරුවරයාට ලැබෙන්නේ නැහැ.

ගුරු වෘත්තිය ඇතුලේ විතරක් නෙවෙයි, ඕනෑම වෘත්තීයයක් ඇතුලේ ඒක එහෙම තමයි. එහෙම නැතුව වෘත්තිකයකුට වෘත්තීමයභාවයක් ලැබෙන්නේ නැහැ. ආරක්ෂක හමුදාවන් ඇතුලේ වෘත්තියභාවය ආරක්ෂා කිරීමට ගොඩක් දැඩි නීති රීති සමුදායක් තියෙනවා. ආයුධයක් අතැතිව සිටින හමුදා සෙබලකු ඒ ආකාරයෙන් ශික්ෂණය නොකොළොත් වෙන්න පුළුවන් විනාශයන්ගේ කෙලවරක් නැති වෙයි. වෛද්‍ය වෘත්තිය ගත්තත් ආරක්ෂා කරන වෘත්තිමයභාවය ඇතුලේ තමන්ගේ මාරාන්තික සතුරාට වුණත් ලෙඩෙක් නම් වෙදකම් කිරීම වෙන්න ඕන. ශික්ෂණය කියන්නේ එහෙම දෙයකට.

ජනමාධ්‍ය ක්ෂේත්‍රය ගත්තත් චිරාත් කාලයක ඉඳලා එහි වගකීම සහගත බව පවත්වාගෙන යන්න ආරක්ෂා කරන ආචාර ධර්ම තියෙනවා. ලියන්නන් වාලේ ඕනෑම දෙයක් ලිවීමේ හැකියාව පුවත්පත් කලාවේදියකුට නැහැ. තොරතුරුවල නිරවද්‍යතාවය, අපක්ෂපාතී බව, වගකීම් සහගත බව අතිශයින්ම වැදගත්. මාධ්‍ය ක්ෂේත්‍රය තුළම සකසා ගත් ආචාර ධර්ම තියෙනවා වගේම මාධ්‍ය නිසා අනෙකෙකුට වන අසාධාරණයක්, වැරැද්දක්, අපහාසයක් වගේ දේවල්වලින් ආරක්ෂා වීම වෙනුවෙන්ද නීති රීති තියෙනවා. මේවා ආචාර ධර්ම සමඟ ගැටෙන ඒවා නෙවෙයි. ඒවාට සමගාමීව අනෙකාගේ නිදහස වෙනුවෙන් තියෙන දේවල්. අනෙක් වෘත්තීන්වලටත් බලපැවැත්වෙන නීති රීති තිබෙන්නෙත් වෘත්තීය තුළ ශික්ෂණයට විරුද්ධව නෙවෙයි. අනෙකාගේ ආරක්ෂාව වෙනුවෙන් ගන්න පුළුවන් යුක්ති සහගත ක්‍රියාමාර්ගයක් සමාජය තුළ තිබීම විය යුතු නිසයි.

මේ විදිහට මේ දවස්වල ගොඩක් කතා බහට ලක්වෙමින් තියෙනවා සමාජ මාධ්‍ය නියාමනය ගැනත්. මෙතන කතා කරන්න ඕන දෙයක් තියෙනවා. සමාජ මාධ්‍යයන් පාවිච්චිකරන අයට ඒ නිදහස තියෙන්න ඕන. ඒක ගැන විවාදයක් නැහැ. ඒත් වැදගත්ම දේ ඒකටත් ශික්ෂණයක් තියෙන්න ඕන වීමයි. ඒත් සමාජ මාධ්‍ය භාවිත කරන්නන් කියන්නේ මොකක් හරි වෘත්තීමය සීමාවකට කොටු කරන්න පුළුවන් අය නෙවෙයි. ඒ නිදහස් අවකාෂයේ විවිධ තලවල නියෝජනයන් තිබුණත් ඒ ඔක්කොම පොදු ජනතාවයි. ඒ නිසා වෘත්තීමයභාවයක්, ශික්ෂණයක්, විනයක්, ආචාරධාර්මික ස්වයංවාරණයක් මේක ඇතුලේ කොහොමටවත් තියාගෙන යන්න බැහැ. ඒ වගේම එහෙම තහංචි දැමීමක් කරන්නත් ප්‍රායෝගිකව බැහැ. ඒක එහෙම වුණත් මේ සමාජ මාධ්‍ය නිසා මොකක් හරි අගතියක් වෙන අයකු වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් නීතියක් රීතියක් තියෙන්න ඕන. එහෙම වෙන්නේ නැතිනම් ඒක බරපතල අපරාධයක්. මොකද සමාජ මාධ්‍ය භාවිතාවකින් කෙනෙකුට පදනම් විරහිත ප්‍රකාශනයක් රැවටීමක් වගේ දෙයක් හින්දා වෙන්න පුළුවන් අසාධාරණයකින් අයුක්තියකින් වෙන හානිය වලක්වා ගැනීමට හරි ඒ හානි පූරණය වෙනුවෙන් හරි නීතිමය ක්‍රමවේදයක් රාජ්‍යය සලස්වන්නේ නැතිනම් ඒකේ තේරුම රාජ්‍යයද අපරාධකාරිත්වයට පහසුකම් සලසනවා කියන එකයි. ඒ නිසා රාජ්‍ය පාලනය විසින් පුරවැසියා වෙනුවෙන් ඒ වගකීම දරන්න ඕන. ඒක අත්හැරිය නොහැකි වගකීමකි.

ඒ වගකීම අත් හැරීමෙන් වෙන්නේ අනාගතයේදි ශික්ෂණයක් නැති පරපුරක් බිහි වෙන එක. එහෙම සමාජයක පැවැත්ම කියන්නේ ජරාජීර්ණ වුණු, අපරාධකාරී, නූගත්, මුග්ධ, අශිෂ්ඨ සමාජයක් ඉතුරු වෙන එකයි.

ලොකු












පිටකෝට්ටේ, මිෂන් පාර, අංක 19/5/ඒ දරණ ස්ථානයේ පදිංචි කේ.පී.අයි. ප්‍රියංගනී වන මා විසින් උඩහමුල්ල, විජේරාම මාවගේ පිහිටි TDL මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී